රජයේ මූල්‍ය ප්‍රකාශන - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මහා භාණ්ඩාගාරයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ රජයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 වගන්තිය ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රජයේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ඔක්තෝබර් 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි රජයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	නිර්දේශ
1.7.1(අ)	ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.
1.7.1(ආ)	පරිශීලකයන්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.
1.7.1(ඉ)	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.
1.7.1(ඊ)	ගිණුම්කරණ පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයන් හඳුන්වා දී ඇති බැවින්, ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කළ යුතු වීම.
1.7.1(උ)	-එම-
1.7.1(ඌ)	මූල්‍ය ප්‍රකාශන සංරචක නිසි පරිදි හඳුනා ගැනීමට හා තහවුරු කරගැනීමකින් පසුව පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.
1.7.1(එ)	-එම-
1.7.1(ඒ)	ගිණුම්කරණ මූලධර්මවලට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.
1.7.1(ඔ)	-එම-
1.7.1(ඕ)	ගිණුම්කරණ පදනම මත පිළියෙල කරනු ලබන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතු වීම.
1.7.1(ග)	වියදම් වර්ගීකරණය නිවැරදි ලෙස සිදු කළ යුතු වීම.
1.7.1(ච)	ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.
1.7.1(ට)	ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය එහි අර්ථය නිරූපණය වන පරිදි පිළියෙල කළ යුතු වීම.
1.7.1(ත)	රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.
1.7.1(ද)	සියළු ණය ගිණුම්ගත කර අදාළ වියදම් නිවැරදිව සටහන් කළ යුතු වීම.
1.7.1(න)	ණය ගිණුම්ගත කිරීම කාලච්ඡේද සංකල්පයට අනුකූලව සිදු කළ යුතු විම.
1.7.1(ම)	ණය ලබා ගැනීම් නිවැරදි කාලච්ඡේදය තුළ නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වීම.
1.7.1(ය)	රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.
1.7.1(ර)	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම හා ප්‍රතිලබ්ධි ප්‍රමාද වීම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

1.7.1(ල) ණය ලබාගෙන අත්පත් කර ගනු ලබන වත්කම් නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වීම.

1.7.1(ව) සෘන ණය වටිනාකම් පැනනැගීමට හේතු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම.

1.7.1(අආ) ණය ප්‍රදායක ආයතන සමඟ ණය ශේෂ නිරන්තරයෙන් සැසඳුම් කළ යුතු අතර, අවශ්‍ය නිවැරදි කිරීම් නිසි විමසා බැලීමකින් අනතුරුව සිදු කළ යුතු වීම සහ අවශ්‍ය පරිදි හෙළිදරව් කිරීම.

1.7.1(අඇ) රජයේ හිමිකාරීත්වය දරන ආයතනයන් හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම් හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අන්තර්ගත කළ යුතු වීම.

1.7.1(අඋ) -එම-

1.7.1(අඒ) රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියා මාර්ග ගැනීමට හා ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.

1.7.1(අඔ) -එම-

1.7.1(අඕ) -එම-

1.7.1(අක) චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම, අමාත්‍යාංශය යටතේ වන විවිධ දෙපාර්තමේන්තු අතර මනා සබඳතාවයක් හා සම්බන්ධීකරණයකින් කටයුතු කිරීමට හා ඊට පටහැනිව කටයුතු කරන පාර්ශවවලට අදාළ නිසි පියවර ගත යුතු වීම.

1.7.1(අග) මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට වැදගත් වන තොරතුරු උචිත ලෙස හෙළිදරව් කළ යුතු වීම.

1.7.1(අට) -එම-

1.7.1(අඩ) -එම-

1.6 මූල්‍ය ප්‍රකාශන

1.6.1 රජයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව පිළියෙල කර ඇති ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා ඇති පොදු අරමුදලේ ආරම්භක ශේෂයට සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හෝ	පොදු අරමුදලේ ශේෂය සමන්විත වී ඇත්තේ ඒකාබද්ධ අරමුදලේ ශේෂය හා ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂය යන ශේෂ දෙකෙහි එකතුවෙන්	ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කළ යුතු

	ඌනතාවයත්, අතීතානුයෝගීව සිදු කරනු ලබන අනෙකුත් ගැලපීම් (Retrospective Adjustments) ඇතුළු සමාලෝචිත වර්ෂයට අදාල වූ ගැලපීම් ඇතුලත් කළ යුතුය. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ විචලනයන්ගෙන් ඒකාබද්ධ අරමුදලේ විචලනයන් සමඟ හිලව් විය යුතු ශේෂයන් සහ විදේශ විනිමය විචලන ලාභය ඉවත් කර අතීතානුයෝගී ගැලපීම් ලෙස, වත්කම් වලින් සිදු වූ බලපෑම් සහ ණය ලබා ගැනීම් වලින් සිදු වූ බලපෑම් ගලපා පොදු අරමුදලේ අවසාන ශේෂය ගණනය කර ස්කන්ධය / ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා තිබුණි. මේ හේතුවෙන් අතීතානුයෝගීව ගැලපීම් නොකළ යුතු ගැලපීම්ද ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට වක්‍ර ලෙස ගැලපී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ දී මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් වලට සිදු කරන ලද ගැලපීම්, විදේශීය හා දේශීය ණය ශේෂයන්ට සිදු කරන ලද ගැලපීම් හා වැරදි නිවැරදි කිරීමේ ගැලපීම් පොදු අරමුදලට වක්‍ර ලෙස ගැලපී තිබීම නිසා ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර ඇති ආකාරය ගිණුම්කරණ මූලධර්ම අනුව නිවැරදි නොවන බවත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට එම ගැලපීම් පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නොහැකි බවත් නිරීක්ෂණය විය.	බැවින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂයන්ගේ සිදු වූ වෙනස්කම් ද පොදු අරමුදලට ගලපා ඇත.	වීම.
(ආ)	භෞතික වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම් සහ වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්, එක් එක් වත්කම් පංතිය අනුව විධිමත් වර්ගීකරණය කිරීමකින් තොරව එකතුව රු.මිලියන 476,457 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් අනුව වත්කම් රු.මිලියන 433,708 කින් පමණක් වැඩි වී තිබුණි. ඒ අනුව රු.මිලියන 42,749 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ පොදු අරමුදලට වක්‍ර ලෙස ගැලපී තිබුණි.	වැය විෂයය අංක 2101 සිට 2108 දක්වා මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයයන් යටතේ ගිණුම්ගත කරනු ලබන සම්පූර්ණ වටිනාකම් මූල්‍ය නොවන වත්කම් කේවළ ශේෂයන් යටතට ඇතුළත් කිරීමේ වගකීම අදාළ වාර්තාකරණ ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සතු වගකීමක් වන අතර එසේ වාර්තා කළ වත්කම් අගය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 14 හි දැක්වේ.	මූල්‍ය ප්‍රකාශන මූලිකාංග (elements) නිසි පරිදි හඳුනා ගැනීමට හා තහවුරු කරගැනීමකින් පසුව පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.

		වැය විෂයය අංක 2301 ප්‍රාග්ධන දායකත්වයට අදාළව ඇති වෙනසට හේතු, පැහැදිලිකිරීමේ සටහන්වල “රජයට අයත් හා වෙනත් සමාගම්වල කොටස් හිමිකාරීත්වය” යටතේ දක්වා ඇත.	
(ඇ)	සමාලෝචිත වර්ෂය තුල දී මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.මිලියන 69,424 ක් වැය කර තිබුණ ද, ප්‍රාග්ධන දායකත්ව ගිණුම අනුව එය රු.මිලියන 87,285 ක් ලෙස දක්වා තිබුණි. මේ හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගෙවීමකින් තොරව සිදුවූ රු.මිලියන17,861 ක ප්‍රාග්ධන දායකත්වය, වගකීමක් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට වත්කම් වලින් සිදුවන බලපෑමක් ලෙස ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූල නොවී පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.	පැහැදිලි කිරීමේ සටහන් අංක 05 යටතේ වැය විෂයය අංක 2301 ප්‍රාග්ධන දායකත්වයට අදාළව ඇති වෙනසට හේතු, “රජයට අයත් හා වෙනත් සමාගම්වල කොටස් හිමිකාරීත්වය” යටතේ දක්වා ඇත. ඊට අමතරව පසුගිය වර්ෂවල වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් කීපයක් ද යොදා ඇත.	ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූල වන පරිදි ගිණුම් තැබීම සිදු කළ යුතු වීම.
(ඈ)	ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගෙන තිබූ රු.මිලියන 788,682 ක ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී රු.මිලියන 547,127 ක කාලීන ණය හා රු.මිලියන 224,358 ක භාණ්ඩාගාර බැඳුම්කර ලෙස පරිවර්තනය කර තිබුණි. එසේ වුවද, පරිවර්තනය හේතුවෙන් පැනනැගී තිබූ රු.මිලියන 17,197 ක වෙනස සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය ප්‍රකාශයට ගැලපීමකින් තොරව පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.	එම ශේෂය, අදාළ ණය මුදල ලංකා බැංකුවේ කාලීන ණය, මහජන බැංකුවේ කාලීන ණය හා භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීමෙන් අනතුරුව ඉතිරි වූ ශේෂය වේ. දැනට භාවිතයේ පවතින ගිණුම්කරණ ක්‍රමවේදය අනුව ණය මුදල හා සමගාමී ණය ආයෝජන ගිණුම හරහා පියවීමට කටයුතු කර ඇත.	-එම-
(ඉ)	අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 13 අනුව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය ශේෂය, කාලීන ණය බවට පරිවර්තනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ලංකා බැංකුවෙන් රු.මිලියන 484,033 ක් සහ මහජන බැංකුවෙන් රු.මිලියන 167,162 ක් ලෙස එකතුව	එක් ණය ගැණුම් උපකරණයක් තවත් ණය ගැණුම් උපකරණයක් බවට පරිවර්තනය කිරීමේ දී ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වාර්තා වන ගනුදෙනු, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර මෙහිදී මුදල් ගලාඒම් හා ගලායාම් එකිනෙක ගැලපීමෙන් අනතුරුව මුදල්	ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.

	රු.මිලියන 651,195 ක් ණය ලබා ගැනීම් ආකාරයට දක්වා, එයින් කාලීන ණය බවට පරිවර්තනය කිරීම් ලෙස ලංකා බැංකුවට අදාළව රු.මිලියන 410,430 ක් සහ මහජන බැංකුවට අදාළව රු.මිලියන 136,698 ක් දක්වා තිබුණි. මේ හේතුවෙන් මුළු දේශීය ණය ගැනීම් ලෙස ලංකා බැංකුවට අදාළව රු.මිලියන 73,603 ක් ද මහජන බැංකුවට අදාළව රු.මිලියන 30,464 ක් ද ලෙස එකතුව රු.මිලියන 104,067 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිරූපණය වී තිබුණි. නමුත් එම අගය අදාල ණය පරිවර්තනය කිරීමෙන් අනතුරුව ඒ මත හිඟ හිටි පොළිය බවට අනාවරණය විය.	ප්‍රවාහ ප්‍රකාශයේ අවසන් ශේෂයට බලපෑමක් සිදුනොවේ.	
(ඊ)	ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත මහජන බැංකුවෙන් ලබා ගෙන, පසුව මහා භාණ්ඩාගාරයට පවරාගත් රු.මිලියන 262,583 ක ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කළා සේ සලකා අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 13 හි දක්වා, ඉන් රු.මිලියන 224,358 ක් ප්‍රතිව්‍යුහගතකරණය කිරීම ලෙස අඩු කර දක්වා තිබුණි. ඒ අනුව, රු.මිලියන 38,225 ක් සමාලෝචිත වර්ෂයේ දේශීය ණය ගැනීම්වලට වක්‍ර ලෙස එකතු වී තිබුණද, එම අගය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් ප්‍රාග්ධනිත කළ හිඟ හිටි පොළිය බව නිරීක්ෂණය විය.	රජයේ ඇපකර මත ලබාදුන් ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණයේ දී හිඟ හිටි පොලී වටිනාකම ද ඇතුළත් කර අදාළ ප්‍රතිව්‍යුහගතකරණය සිදුකර ඇත.	ගණුදෙනු වල නියම ස්වරූපය පිළිබිඹු වන පරිදි ගිණුම් තැබීම සිදු කළ යුතු වීම.
(උ)	ලංකා බැංකුවෙන් ලබාගෙන තිබූ ඇ.ඩො.මිලියන 240 හෙවත් රු.මිලියන 77,742 ක විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය (ව්‍යාපෘති නොවන) සමාලෝචිත වර්ෂය තුළ ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ හිඟ පොළියද ඇතුළුව රු.මිලියන 82,551 ක භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි. මෙහිදී සත්‍ය මුදල් ගලා ඒමක් හෝ ගලා යෑමක් සිදුවී නොතිබුණද, ඒවා ණය ලබා ගැනීම් සහ ණය ආපසු ගෙවීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.	එක් ණය ගැණුම් උපකරණයක් තවත් ණය ගැණුම් උපකරණයක් බවට පරිවර්තනය කිරීමේ දී ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වාර්තා වන ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. මෙහිදී මුදල් ගලාඒම් හා ගලායාම් එකිනෙක ගැලපීමෙන් අනතුරුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසන් ශේෂයට බලපෑමක් සිදුනොවේ.	ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.

(ඖ)	2023 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව, මූල්‍ය නොවන වත්කම් රු.මිලියන 2,537,167 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී ආරම්භක ශේෂය රු.මිලියන 3,250,238 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂයේ විගණිත අවසාන ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු.මිලියන 713,071 ක වෙනසක් නිරීක්ෂණය විය.	මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ වගකීම එක් එක් වාර්තාකරණ ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් සතු වගකීමක් වන අතර එසේ එක් එක් ආයතනවලින් වාර්තා කරනු ලබන වත්කම් ශේෂයන්ගේ එකතුව රජයේ මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපණය වේ.	මූල්‍ය ප්‍රකාශන මූලිකාංග (elements) නිසි පරිදි හඳුනා ගැනීමට හා තහවුරු කරගැනීමකින් පසුව පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.
(ක)	මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 14 අනුව, වත්කම් මාරු කිරීම් වලට අදාළ ඍන සටහන් ද (Transfer Out) වත්කම් ඉවත් කිරීම් (Disposal) ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රජය විසින් සත්‍ය වශයෙන්ම ඉවත්කරන ලද වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය නොවුණි.	ඉදිරියේ දී ගිණුම්කරණ පද්ධතිය තුළ අවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සලකා බැලීම සඳහා සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශන තුළින් තොරතුරු නිවැරදිව ඉදිරිපත් කළ යුතු වීම.
(ඛ)	මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 15 අනුව, 2023 වර්ෂයට අදාළව අතීතානුයෝගී ගැලපීම් ලෙස රු.මිලියන 79,728 ක් ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය මඟින් ද, සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 26,003 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ද, එකතුව රු.මිලියන 105,731 ක් රජයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ආයෝජන වත්කම් ලෙස ද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. කෙසේ වුවද, මෙම ආයෝජන සිදු කර ඇති ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව, රජයට එවැනි අයිතියක් /ඇල්මක් (interest) පවතින බවට තහවුරු නොවුණි. මූල්‍ය ප්‍රකාශන සටහන අනුව පළාත් සභා සඳහා රජයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ආයෝජන ලෙස එකතුව රු.මිලියන 14,942 ක් දක්වා තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශන වල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ පළාත් සභාවල මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් රජයට සැලකිය යුතු පාලනයක් නොමැති බැවින්, පළාත් සභාවල ආදායම සහ වියදම් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස නොසැලකෙන බවද දක්වා තිබුණි.	මෙම වටිනාකම රජයේ වියදමෙන් එක් එක් ආයතන හරහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා කරන ලද ආයෝජනයක් මිස අදාළ ආයතනවල අයිතිය අත්පත් කර ගැනීම පිණිස කරන ලද ආයෝජනයක් නොවේ. එබැවින්, එක් එක් ආයතනවල මූල්‍ය ප්‍රකාශනවල රජයට ඇති අයිතියක් ලෙස මෙම ආයෝජනය හඳුනාගෙන නැත. කෙසේ වුව ද, ආයෝජන හරහා ජනනය වන වත්කම් අදාළ ආයතනවල ශේෂපත්‍ර තුළ නිරූපණය වේ.	මූල්‍ය ප්‍රකාශන වල මූලිකාංග හඳුනා ගැනීමේදී ඒවායේ සැලහුම් නිසි පරිදි පරීක්ෂා කර බැලිය යුතු වීම.

(ඔ)	2022 ජනවාරි 01 දින සිට ඒකාබද්ධ අරමුදලේ සහ ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ පැවති පිළිවෙලින් රු.මිලියන 990,491ක් සහ රු.මිලියන 14,040,298 ක් වූ ඍන වටිනාකම් එකතු කර රු.මිලියන 15,030,789 ක් පොදු අරමුදල (General Fund) ලෙස එය ස්කන්ධය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට ගෙන තිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් මඟින් අනෙකුත් අරමුදල් පිළිබඳව හෙළිදරව් කර තිබුණද, පොදු අරමුදල පිහිටවීමේ/ඇතිකිරීමේ පදනම හෙළිදරව් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ශේෂය රු.මිලියන 20,951,036 ක ඍන ශේෂයක් වී තිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට පවතින පොදු අරමුදලේ ශේෂය පදනම් කරගෙන ඒකාබද්ධ අරමුදලේ ශේෂය ගණනය කළ හැකි ආකාරය දක්වමින් මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කිරීමේ පහසුව පිණිස විශ්ලේෂණාත්මක සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.	පොදු අරමුදල පිළිබඳ හඳුන්වාදීමක් ඉදිරියේ දී පැහැදිලි කිරීමේ සටහන් යටතේ ඇතුළත් කිරීමට සටහන් කරගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට නිසි තොරතුරු පැහැදිලි අවබෝධයක් නිවැරදි ආකාරයට ලබාගත හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.
(ඕ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේදී විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ යුරෝ මිලියන 4.5 ක් වූ ණය ගිවිසුමකට අදාළව යුරෝ මිලියන 2.4 ක් හෙවත් රු.මිලියන 738 ක් ණය හිමියන් විසින් අත්හරින ලද (Hair cut) බව දක්වා තිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 26 (ii) අනුව, මෙම ණය ගිවිසුමට අදාළව යුරෝ මිලියන 1.9 හෙවත් රු.මිලියන 627,588 ක් ප්‍රතිවර්ත (Reverse) කල බවට දක්වා තිබුණද එම සටහනේ පාද සටහනට (Foot Note) අනුව මෙම ණය ගිවිසුම යටතේ ප්‍රාග්ධනීකරණය කරන ලද මුදලින් රු.මිලියන 821ක ණය කපා හැරීමක් (Hair cut) කර ඇති බව දක්වා තිබුණි. තවද, මෙම ණය ශේෂ අත්හැරීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙන් අත්හැරී තිබූ අතර ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය තුළ පොදු අරමුදලට වක්‍ර ලෙස ගලපා තිබුණි.	ඉදිරියේ දී පවත්නා ගිණුම්කරණ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම තුළින් නාමික ගිණුම් ඉවත් කිරීමට ක්‍රියා කරමින් පවතී.	ගණුදෙනු ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව ගිණුම් ගත කළ යුතු වීම.

(ක)	අයවැය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් අංක 11 හි දක්වා තිබූ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය හේතුවෙන් ජනිත වූ ව්‍යාපෘති ණයවලට අදාළ රු.මිලියන 89,097 ක හිඟ හිටි ණය පොළී වටිනාකම සමාලෝචිත වර්ෂය තුළ ලබා ගත් විදේශීය ණය මුදලක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි.	එක් ණය ගැණුම් උපකරණයක් තවත් ණය ගැණුම් උපකරණයක් බවට පරිවර්තනය කිරීමේ දී ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වාර්තා වන ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. මෙහිදී මුදල් ගලාඒම් හා ගලායාම් එකිනෙක ගැලපීමෙන් අනතුරුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසන් ශේෂයට බලපෑමක් සිදුනොවේ.	නියමිත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුදල් පදනම මත මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.
(ග)	මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (iv) අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙනුවෙන් ඇ.ඩො.මිලියන 12,281 ක් හෙවත් රු.මිලියන 3,362,306 ක් ගෙවීම් ලෙස දක්වා තිබුණ ද විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව එවැනි ගෙවීමක් සිදුකර නොතිබුණි. මෙහිදී කිසිදු මුදල් ගලා යාමක් සිදුවී නොමැති වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙම අගය විදේශීය ණය ගෙවීමක් ලෙස දක්වා තිබුණි. තවද, මෙලෙස ගෙවීම් ලෙස සඳහන් කර තිබූ වටිනාකමට අදාළව රු.මිලියන 624,319 ක හුවමාරු ලාභයක් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගලපා තිබූ අතර එකී ගණනය කිරීමේ පදනම හා ඊට අදාළ අනෙකුත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	එක් ණය ගැණුම් උපකරණයක් තවත් ණය ගැණුම් උපකරණයක් බවට පරිවර්තනය කිරීමේ දී ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වාර්තා වන ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර ඇත. මෙහිදී මුදල් ගලාඒම් හා ගලායාම් එකිනෙක ගැලපීමෙන් අනතුරුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවසන් ශේෂයට බලපෑමක් සිදුනොවේ.	නියමිත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු බව.
(ච)	සමාලෝචිත වර්ෂයේ ස්වෛරීත්ව බැඳුම්කර ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී කිසිදු මුදල් ගලා ඒමක් සිදු නොවූ රු.මිලියන 3,206,577 ක ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද වටිනාකම, ණය ලබා ගැනීමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	-එම-	-එම-
(ජ)	සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නාම මාත්‍රික ගිණුමක් ලෙස පැවති විදේශීය ණය චක්‍රීය අරමුදල (Foreign Loan Revolving Fund), විදේශීය ණය ගැලපුම් ගිණුම (Foreign Loan Adjustment Accounts) ලෙස වෙනස් කර තිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන වල පටුනේ (Table of Contents) හා පැහැදිලි කිරීමේ සටහන් අංක 09 යටතේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම	නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගතය නිවැරදි ලෙස ඉදිරිපත් කළ යුතු වීම.

	නමින්ම සඳහන් කර තිබුණු අතර නව ගිණුම් නාමය වන විදේශීය ණය ගැලපුම් ගිණුම පිළිබඳව පැහැදිලි කිරීමේ සටහනක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, විදේශ ව්‍යවහාර මුදලින් පැවති මූල්‍යමය වත්කම් (Monitory Assets) (විදේශ ව්‍යවහාර මුදලින් ඇති ආයෝජන හැර) දේශීය ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇති වූ රු.මිලියන 54,163 ක විදේශ විනිමය හුවමාරු අලාභය ගිණුම්කරණ මූලධර්මවලට අනුව සමාලෝචිත වර්ෂයේදී ගිණුම්කරණ අවශ්‍යතාවය මත පදනම්ව පිළියෙල කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් නොකර, විදේශීය ණය ගැලපුම් ගිණුමේ සටහන්කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අරමුදල් ගිණුමක් ලෙස පෙන්වා තිබුණි.		
(ට)	සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලැබී තිබූ රු.මිලියන 1,110 ක් ඊට අනුරූපී පිරිවැය සමඟ ගලපා ශුද්ධ බලපෑම ගණනය කිරීමකින් තොරව, ලැබී තිබූ මුළු මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි අදායමක් ලෙස දක්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් විකිණීම හා අලෙවි වටිනාකම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් දැනට භාවිත වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව ගිණුම්ගත කර ඇත.	ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කළ යුතු වීම.
(ඩ)	විදේශ ව්‍යවහාර මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇති වන විදේශ විනිමය ලාභය හෝ අලාභය ගිණුම්කරණ පදනම මත පිළියෙල කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතු වුවද, සටහන් අංක 27 හි විවිධ ගිණුම් යටතේ වූ විනිමය සාම්‍ය ගැලපීම් රු.මිලියන 125 ක වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ගැලපීම් කර නොතිබුණි.	නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.	ගිණුම්කරණ මූලධර්ම අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.
(ණ)	සමාලෝචිත වර්ෂයේ කල්බදු ක්‍රමයට ගත් වාහන සඳහා රු.මිලියන 464 ක ප්‍රාග්ධන වාරික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් නොකර, එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ සිදු වූ මුදල් ගලා යෑමක් ලෙස දක්වා තිබුණි.	කල්බදු ක්‍රමය යටතේ වත්කම් අත්පත් කර ගැනීමේ දී අදාළ වටිනාකම එකවර ගෙවීමක් සිදු නොවන අතර කල්බදු වාරිකයට අදාළ ප්‍රාග්ධන ගෙවීම් ප්‍රමාණය පමණක් වැය විෂයය අංක 2108 යටතට ඇතුළත් වේ. ඒ අනුව, අදාළ වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත.	ගිණුම්කරණ මූලධර්ම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.

(ත)	සමාලෝචිත වර්ෂයේදී ද්‍රව්‍ය හා උපකරණ ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 41,899 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහයක් ලෙස වරදවා දක්වා තිබුණි.	ද්‍රව්‍ය හා උපකරණවලින් ප්‍රදාන වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ප්‍රවාහයක් ලෙස සඳහන් වුව ද ඊට අදාළ වියදම ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුදල් ගලායාමක් ලෙස ඇතුළත් කර ඇති බැවින් මෙමගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශේෂයට බලපෑමක් සිදු නොවේ.	-එම-
(ද)	රජයේ දෙපාර්තමේන්තු සමඟ ක්‍රියාත්මක වන ගිණුම් යටතේ අක්‍රීය ගිණුම් ශේෂ (Non-Operating Accounts) ලෙස රු.මිලියන 4,730 ක් දක්වා තිබුණ ද, එහි කාල විශ්ලේෂණයක් සහ එසේ අක්‍රීය ලෙස සැලකීමට හේතු විගණනයට අනාවරණය නොවුණි.	මෙම ශේෂයන් සම්බන්ධව දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි තොරතුරු විශ්ලේෂණය කර අක්‍රියව පැවතීමට හේතු හඳුනාගැනීමට කටයුතු කරමින් පවතී.	මෙම ශේෂ නිරවුල් කිරීමට කඩිනම්ව කටයුතු කළ යුතු වීම.
(න)	මූල්‍ය ප්‍රකාශනවල එකතුව රු.මිලියන 993,765 ක ඉඩම්, නොනිමි වැඩ හැර අනිකුත් මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව විචක්ෂණ හා ගැලපුම් සංකල්පවලට අනුව ක්ෂය කළහැකි වත්කම් සම්බන්ධයෙන් සිදුකලයුතු කිසිඳු ගැලපිල්ලක් සිදුකර පොත්වලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ වියදම හා අදාළ වත්කම්වල සාධාරණ අගය නිරූපණය නොවන බවද විගණනයේදී නිරීක්ෂණය විය.	රජයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදුකරනු ලබන දැනට පවතින ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාළ ක්ෂයකිරීම් ගිණුම්ගත කිරීමක් සිදු නොවේ.	ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කළ යුතු වීම.
(ප)	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඉදිරි වර්ෂය තුළදී රජය විසින් ගෙවා නිම කළ යුතු බාහිර වගකීම් ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත නොහැකි විය.	ඉදිරියේ දී වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය කරමින් පවතී.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.
(බ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය අනුව, මුළු වත්කම් රු.මිලියන 8,359,211ක් වුවද, මුළු බාහිර වගකීම් රු.මිලියන 29,251,796 ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල ශුද්ධ වත්කම් අගය ඍණ රු.මිලියන 20,892,585 ක් වී තිබුණි.	මුළු බාහිර වගකීම්වල වටිනාකමට අදාළව වත්කම් ජනනය වීමක් සිදු නොවන අතර අදාළ වෙනස ව්‍යවස්ථාපිත හා වෙනත් අරමුදල් මගින් නියෝජනය වේ.	හඳුනා නොගත් රජයේ වත්කම් මූල්‍ය ප්‍රකාශන තුල හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම.

<table>
<tr><td>(ම)</td><td>මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය මත පිළියෙල කර ඇති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මූල්‍ය හිඟය මූල්‍යනය කර ඇති ආකාරය නිරූපණය නොවුන ද, රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ පරිශීලකයන්ට සටහන් (Note to Readers) යටතේ “සමාලෝචිත වර්ෂයේ මූල්‍ය හිඟය, මූල්‍යනය කර ඇති ආකාරය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් නිරූපණය කරන බව” දක්වා තිබුණි.</td><td>නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.</td><td>පරිශීලකයින්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.</td></tr>
<tr><td>(ය)</td><td>මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 මඟින් විදේශීය මුදලින් ලබා ගෙන තිබූ දේශීය ණය වලට අදාළ විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම හෙළිදරව් කර නොතිබුණි.</td><td>විදේශ මුදලින් වන දේශීය ණය ගැනීම් සඳහා අවශ්‍ය පරිදි ඉදිරි වර්ෂවලදී හෙළිදරව් කිරීම් සිදුකිරීමට සටහන් කර ගතිමි.</td><td>පරිශීලකයින්ට වැදගත්වන තොරතුරු හෙළිදරව් කළ යුතු වීම.</td></tr>
<tr><td>(ර)</td><td>සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හර ශේෂ පැවති විවිධ ගිණුම් (Sundry Accounts) සහ රජයේ දෙපාර්තමේන්තු සමඟ ක්‍රියාත්මක වන ගිණුම් (Accounts generating with Government Departments) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වගකීම් යටතේ අඩුකර දක්වා තිබුණි.</td><td>විගණන නිරීක්ෂණය අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.</td><td>වත්කම් ශේෂ සහ වගකීම් ශේෂ හිලව් කර දැක්වීම නොකළ යුතු වීම.</td></tr>
<tr><td>(ල)</td><td>ගිණුම්ගත නොවූ විදේශ ණය

මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් 02 (Explanatory Notes) යටතේ 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණය වටිනාකම රු.මිලියන 1,070 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඒවායේ ප්‍රතිලබ්ධි (disbursements) කාලයන් හි පහත වෙනස්කම් නිරීක්ෂණය විය.
<table>
<tr><th>ණය අංකය</th><th>මූල්‍ය ප්‍රකාශනය අනුව ප්‍රතිලබ්ධි වූ කාලය</th><th>භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වේ තොරතුරු අනුව ප්‍රතිලබ්ධි වූ කාලය</th></tr>
<tr><td>2012017</td><td>2020 දෙසැම්බර්</td><td>2024</td></tr>
<tr><td>2012025</td><td>2023 නොවැම්බර්</td><td>2024</td></tr>
<tr><td>2016035</td><td>2022 සැප්තැම්බර්</td><td>2022 සැප්තැම්බර් 2023 මාර්තු සහ සැප්තැම්බර්</td></tr>
</table></td><td></td><td></td></tr>
</table>

(i) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2020 සිට 2023 වර්ෂය දක්වා විගණනය වෙත ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව, ඉහත දක්වා ඇති ණය ප්‍රතිලබ්ධි වී තිබූ බව දක්වා නොතිබුණි. ඒ අනුව, එකම ණය ගනුදෙනුවකට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එකිනෙකට පරස්පර තොරතුරු විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ ඒ වගකීම් පැවරූ දෙපාර්තමේන්තු විසින් විදේශ ණය ප්‍රතිලබ්ධිවීම පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන නොමැති බව අනාවරණය විය. තවද, විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුවද, ඉහත ණය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව, ඉහත විදේශීය ණය ගණුදෙනුවලට අමතරව විධිමත් ලෙස වාර්තා නොවූ වෙනත් විදේශීය ණය පැවතීමේ ඉහළ අවධානමක් පැවතිය හැකි බව නිරීක්ෂණය විය.	සෑම ණය උපලබ්ධිවීමක්ම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම්ගත කරනු ලබන්නේ අදාළ ව්‍යාපෘතිය හා අමාත්‍යාංශය විසින් එම උපලබ්ධිවීම් නිවැරදි බවට තහවුරු කිරීමෙන් පසුව පමණි. කෙසේ වුවද, මෙම උපලබ්ධිවීම් වලට අදාළ වියදම නිවැරදි බවට ව්‍යාපෘති කාර්යාලය හා අදාළ අමාත්‍යාංශය විසින් සහතික නොකිරීම හේතුවෙන් එයට අනුරූපී ණය මුදල ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. කෙසේ වුවද, අදාළ ණය මුදල් ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.	රාජ්‍ය ණය ගැනීම් ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.
(ii) සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂ වලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති විදේශ ණය වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.	භාණ්ඩාගාරය විසින් ණය උපලබ්ධිවීම් වාර්තා වූ වහාම අදාල අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව හා ව්‍යාපෘතිය වෙත එම උපලබ්ධි වීම් දන්වා යවනු ලබන අතර මේ සම්බන්ධයෙන් වරින් වර අදාල අමාත්‍යාං ශය වෙත සිහි කැඳවීම් ද යොමුකර ඇත. කෙසේ නමුත් අදාල අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව මඟින් වියදම සහතික නොකිරීම හේතුවෙන් එයට අනුරූපී ණය වගකීම් ද ගිණුම් ගත කිරීමට නොහැකි වී ඇත.	ණය ගිණුම් ගතකිරීම කාලච්ඡේද සංකල්පයට අනුකූලව කළ යුතු වීම.
(iii) මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, සියළුම වියදම්, ගෙවීම් සිදු කර ඇති කාලසීමාව තුළ ගිණුම්ගත කර ඇති බව දක්වා තිබුණ ද, ගිණුම්ගත නොකළ විදේශ ණය	භාණ්ඩාගාරය විසින් ණය උපලබ්ධිවීම් වාර්තා වූ වහාම අදාල අමාත්‍යාංශ හා ව්‍යාපෘති වෙත අදාල වියදම ගිණුම් ගත කිරීමට පියවර ගන්නා ලෙස දැනුම් දී තිබේ. එහෙත් අදාල ආයතන විසින් අප්‍රමාදව වියදම	සමාලෝචිත වර්ෂයට අදාළ සියළු වියදම් ගිණුම්ගත කළ යුතු වීම.

	මුදල් සඳහා අදාලවන පොලී ඇතුළු එම ණය වලින් සිදු කරන ලද අනෙකුත් වියදම් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත නොවී පැවතිය හැකි බව නිරීක්ෂණය විය.	සහතික නොකිරීම හේතුවෙන් එම මුදල ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. කෙසේ නමුත් භාණ්ඩාගාරය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් අදාල ගිණුම්ගත නොවීමේ තත්ත්වයන් මේ වන විට සැලකිය යුතු මට්ටමකින් අඩු කර ගැනීමට හැකියාව ලැබී ඇත.	
(ච)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව 2023 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී තිබුණද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් පිටත පවත්වාගෙන පැමිණි ණය වර්ග 03 කට අදාළව එකතුව රු.මිලියන 15,211 ක් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්ගත කර තිබුණ ද ඒ පිළිබඳව මූල්‍ය ජ්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. ඒ අනුව, යම්කිසි වර්ෂයක් තුළ ප්‍රතිලබ්ධි වුවත්, අදාල වර්ෂය තුළදීම ගිණුම් ගත කිරීමකින් තොරව විවිධ විදේශ ණය ගනුදෙනු පවත්වාගෙන ඇති බවත්, එම ණය ගනුදෙනුවලට අදාල පොළිය ඇතුළු විවිධ වියදම් අදාල කාලච්ඡේදය තුළදීම ගිණුම්ගත වී නොමැති විය හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.	එසේ උපලබ්ධි නොවන විදේශ ණය සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු වෙත නිරන්තර උපදෙස් ලබා දෙමින් ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු සම්පාදනය කිරීමට සටහන් කර ගෙන ඇති අතර, ඒ ඒ අමාත්‍යාංශවල පිහිටුවා ඇති විගණන කාර්යාල දැනුවත් කිරීම කර ඇත. එසේම, එසේ ගිණුම් ගත නොකර ඇති ණය මුදල් වල වටිනාකම ප්‍රමාණාත්මකව අඩු කර ගැනීමට මේ වන විට හැකි වී ඇති අතර තවදුරටත් අදාල ක්‍රියාමාර්ග ගැනීමට ද සටහන් කර ගෙන ඇත.	ණය ගිණුම් ගත කිරීම කාලච්ඡේද සංකල්පයට අනුකූලව සිදු කළ යුතු විම.
(ඡ)	විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No.1 වාර්තාව අනුව, ණය ගිවිසුම් 18 කට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට පැවැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර ශුද්ධ එකතුව රු. මිලියන 3,711 ක වෙනස්කම් නිරීක්ෂණය විය.	ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ විමසා බැලීමේදී අනාවරණය වූ පෙර වර්ෂවල සිදුවූ ගනුදෙනු සමාලෝචිත වර්ෂයේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුවීම, අත්වැරදීමකින් විනිමය වැඩි අගයන් සටහන්වීමේ වරද නිවැරදි කිරීම් හා ප්‍රමාද වී ලද ප්‍රතිලබ්ධි වටිනාකම් සටහන් කිරීම වැනි කරුණු හේතු වී තිබුණි.	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.
(ජ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විදේශීය ණය ප්‍රතිලබ්ධිවීම් සහ විදේශීය ණය වාර්තා කරනු ලබන පද්ධතියේ Stock and Flow Report No. 1 වාර්තාව අනුව ප්‍රතිලබ්ධිවීම් අතර පහත වෙනස්කම් නිරීක්ෂණය විය.	2023 වර්ෂයේදී වූ ප්‍රතිලබ්ධීන් 2024 වර්ෂයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට වාර්තා කර ඇති අතර එය 2024 වර්ෂයේ ගිණුම්ගත කිරීම මෙම වෙනස්කම් වලට හේතු වී ඇත.	-එම-

ණය අංකය	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව	තොරතුරු පද්ධතිය අනුව ප්‍රතිලබ්ධිවීම්	වෙනස
2012024	USD 947,057	USD 709,147	USD 237,910
2019019	USD 28,717,515	USD 24,938,700	USD 3,778,815
2019043	SAR 47,320,932	SAR 47,284,890	SAR 36,042
2015021	EUR 28,227	නැත	EUR 28,227
2012025	SAR 570,876	SAR 272,171	SAR 298,705

වෙනසට හේතු සමාලෝචිත වර්ෂය තුළදීම සිදු වු ප්‍රතිලබ්ධිවීම්ද යන්න විගණනයේදී තහවුරු නොවුණි. එසේ වුවද, මෙම ණය ගිවිසුම්වලට අදාළව පෙර වර්ෂ වල ප්‍රතිලබ්ධි වී ගිණුම්ගත නොකළ නමුත් 2024 වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද ප්‍රතිලබ්ධිවීම් ද නොමැති බවට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබුණි. ඒ අනුව, මෙම ප්‍රතිලබ්ධිවීම් කුමන කාලපරිච්ඡේදයකට අදාලවේද යන්න විගණනයේදී තහවුරු නොවු අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ දැනුවත්භාවයකින් තොරව, ප්‍රතිලබ්ධිවීම් ගිණුම්ගත නොවී පවතින බව නිරීක්ෂණය විය.

(ළ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 න් ඉදිරිපත් කර ඇති විදේශීය ණය ශේෂ සඳහා රු.මිලියන 3,022 ක ගැලපීම් සිදු කර තිබු අතර, මෙම ගැලපීම් හේතු කොට ගෙන විදේශීය ණය ශේෂ එම වටිනාකමින්ම ශුද්ධ වශයෙන් ඉහළ ගොස් තිබුණි. එසේ ගැලපීම් සිදු කිරීමට හේතු වු කරුණු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ණය වාර්තා කරන CSDRMS පද්ධතියේ සඳහන් ණය ශේෂය හා මූල්‍ය ප්‍රකාශනයන්හි ණය ශේෂයන් සංසන්දනය කිරීමේදී හඳුනාගත් වෙනස්කම් නිවැරදි කිරිම සඳහා මෙම ගැලපීම සිදුකර ඇත.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට වැදගත් කරුණු හෙළිදරව් කළ යුතු වීම.
(අඅ)	සමාලෝචිත වර්ෂයේ දී විදේශීය ණය ලබා ගැනීම් 20 කට අදාළව රු.මිලියන 3,969 ක් විවිධ හේතුන් මත අදාළ ණය හිමියන්ට ආපසු ලබා දී (Refund) තිබුණ ද ඊට හේතු මූල්‍ය ප්‍රකාශනවල විධිමත් පරිදි හෙළිදරව් කර නොතිබුණි. තවද, ප්‍රතිලබ්ධි වු ණය අදාළ ණයහිමියන් වෙත ආපසු ලබා දීමේදී එම ණය ප්‍රතිලබ්ධි වු අවස්ථාවේ සිට නැවත ණය හිමියා වෙත	ණය ප්‍රදායක වෙත ආපසු යැවීම් (Refund) ණය ගිවිසුම ප්‍රකාරව බහුපාර්ශවික ණය දෙන ආයතන වෙතින් ලබා ගන්නා ලද ණය මුදල් වලින් කිසියම් ප්‍රමාණයක් ඉතිරි වී තිබේ නම් ව්‍යාපෘතිය අවසානයේදී එසේ ඉතිරි වූ මුදල් ආපසු ගෙවීමෙන්, සුදුසුකම් නොලබන වියදම්	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට වැදගත් කරුණු හෙළිදරව් කළ යුතු වීම.

	ලබා දෙන තෙක් රඳවා ගත් කාලපරිච්ඡේදය සඳහා ණය පොළිය ගෙවීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය.	නැවත ණය ප්‍රදායක වෙත ගෙවීමෙන්, හෝ Mobilization advance ආපසු අය කිරීම වැනි විවිධ හේතු නිසා ඇති විය හැකි සියලුම ආපසු යැවීම් (Refund) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා ණය ප්‍රදායක වෙත ප්‍රේෂණය නොකරන බැවින් එසේ ආපසු ගෙවීම්වලට අදාල සියලු නිශ්චිත හේතු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සතුව නැත.	
(අආ)	මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් මුළුමනින්ම පිටතින් පවත්වාගෙන පැමිණි ණය වර්ග 08 කට අදාළව එකතුව රු.මිලියන 518,293 ණය ශේෂ 2022 වර්ෂයේදී ගිණුම්ගත කිරීමේදී, එම අරමුදල් භාවිතාකර තිබූ ආකාරය හෝ එම අරමුදල් උපයෝගීකරගෙන අත්පත් කර ගන්නා ලද කිසිදු වත්කමක් මේ දක්වා හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගලපා නොතිබුණු අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පොදු අරමුදලේ ඍණ ශේෂය තවදුරටත් ඉහළ යෑමට හේතු වී තිබුණි.	කැබිනට් මණ්ඩල තීරණයක් අනුව මෙම ණය ශේෂයන් 2022 වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරන ලදී. මෙම ණය ලබාගෙන අත්පත් කර ගන්නා ලද වත්කම් අදාළ රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ.	ණය ලබා ගෙන අත්පත් කර ගනු ලබන වත්කම් හෝ ආයෝජනයන් නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වීම.
(අඇ)	මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26 (II) අනුව, අංක 2024001 දරන ණය, ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණයක් ලෙස දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන වල අයවැය කාර්යසාධන වාර්තාවේ සටහන් අංක 11 අනුව සහ Stock and Flow Report No. 01 අනුව මෙය අන්තර්ජාතික සංවර්ධන සංගමයෙන් (International Development Association) ලබා ගත් ණයක් ලෙස දක්වා තිබුණි.	එය ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගෙන ඇත.	මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු ඉදිරිපත් කිරීමේදී නිවැරදි විය යුතු වීම.
(අඈ)	අයවැය ක්‍රියාකාරීත්වය සහ හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශයේ සටහන් අංක 14 මඟින් දේශීය ණය ආපසු ගෙවීම්වලට අදාළ තොරතුරු හෙළිදරව්කර තිබුණ ද, 2024 වර්ෂය තුළදී විදේශ ණය ආපසු ගෙවීම් රු.මිලියන 3,634,067 ට අදාළව තොරතුරු සටහනක් මඟින් හෙළිදරව් කර නොතිබුණි.	විදේශ ණය ආපසු ගෙවීම සඳහා වෙනම සටහනක් ඉදිරියේදී ඉදිරිපත් කල හැකි බව දන්වා සිටිමි.	තොරතුරු ඉදිරිපත් කිරීමේ සංගතතාවයක් පැවතිය යුතු වීම.

(අඉ)	සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබූ ජාත්‍යන්තර සංවර්ධන බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 26(iv) හි පාද සටහන මඟින් විනිමය සාම්‍ය (parity) තුළ ණයහිමියන් අත්හරින ලද ණය ප්‍රමාණයද (Haircut) ඇතුළත් වන බව දක්වා තිබුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ජාත්‍යන්තර සංවර්ධන බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයේදී ණය හිමියන් විසින් අත්හරින ලද ණය ප්‍රමාණය සෘජුව හඳුනාගැනීමට ඇති හැකියාව අහිමි වී තිබුණි.	ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයේදී ණය හිමියන් විසින් අත් හරින ලද ණය ප්‍රමාණය (Haircut Amount) සෘජුව හඳුනාගැනීම සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවූ බැවින් ණය හිමියන් විසින් අත්හරින ලද ප්‍රමාණය පිළිබඳව විස්තර මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කල නොහැකි විය.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට වැදගත් තොරතුරු සම්පූර්ණයෙන්ම හෙළිදරව් කළ යුතු වීම.
(අඊ)	ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ Stock and Flow Report No 01 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය අංක 1990009 ට අදාළව රු.787,553 ක් වැඩියෙන්ද, ණය අංක 2024001ට අදාළව රු.මිලියන 87 ක් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කර තිබුණි.	විවිධ විනිමයෙන් සටහන් කර ඇති තොරතුරු මෙම ණයෙහි මූර්ත විනිමය (Denominated Currency) ට පද්ධතිය විසින් පරිවර්තනය කිරීමේදී ඇති වී ඇති විනිමය වෙනස හේතුවෙන් අදාළ විෂමතාවය ඇති වී ඇත. එම විෂමතාව මේ වන විට නිවැරදි කර ඇත. තවද, 2024.12.31 දිනට අදාළව 2025.01.31 දින සැකසූ Stock and Flow Report වාර්තාවේ 2024.12.20 දිනට අදාළව සිදුවූ ආපසු ලබා දීමක් (Refund) පද්ධතියේ නිවැරදිව යාවත්කාලීන කර ඇත. නමුත්, අදාළ ණයහිමියා විසින් 2024.12.31ට අදාළව එවන ලද ශේෂයන්හි එම ආපසු ලබාදීම (Refund) එම ශේෂ ලබා ගන්නා අවස්ථාවේ යාවත්කාලීන කර නොමැති බව පෙනී යයි.	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය වාර්තා කිරීම හා ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.
(අඋ)	සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 122 සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය (ACA 5 (බී)) ඇතුලත් කර නොතිබූ අතර රජයේ මූල්‍ය ප්‍රකාශනවල එම වැය ශීර්ෂයට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 2.8 ක ශේෂයක් පැවතුණි.	සෑම වියදම් ඒකකයක් විසින්ම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කිරීමේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී විසින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරන ප්‍රකාශයෙහි අදාළ වියදම් ඒකකයෙහි ඇතුළත් තොරතුරු භාණ්ඩාගාර පොත් සමඟ	අදාළ ආයතන සමඟ කුලී වැඩ හා අත්තිකාරම් ශේෂ සැසඳුම් කළ යුතු අතර අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම.

		සැසඳෙන බවට සහතික කර ඇති බැවින් එලෙස භාණ්ඩාගාර පොත් සමඟ නොසැසඳෙන තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඔවුන් පෞද්ගලිකව වගකීම දැරිය යුතුවේ.	
(අඌ)	ශීර්ෂ 123 නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනයේ ACA 5(ඕ) ආකෘතියට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස සඳහන් කර ඇති රු.මිලියන 586 ක කුලී හා වැඩ අත්තිකාරම් ශේෂය, රජයේ මූල්‍ය ප්‍රකාශනයේ සමාලෝචිත වර්ෂය තුළ එකතු කිරීම් යටතේ දක්වා ඇති බව නිරීක්ෂණය විය.	-එම-	-එම-
(අඑ)	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශීර්ෂය 219 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමකට අදාළව රු.මිලියන 5.7 ක් වූ ආරම්භක ශේෂය, සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගෙන තිබූ බව සඳහන් වුවද, අදාළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල එම අගය නොවෙනස්ව පැවතුණි.	-එම-	-එම-
(අඒ)	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ශීර්ෂ 337 කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂය රු.මිලියන 22 ක් ලෙස නොවෙනස්ව පැවතියද, අදාළ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව කිසිඳු සඳහනක් නොතිබුණි.	පිළිතුර ලැබී නැත.	-එම-
(අඔ)	මහා භාණ්ඩාගාරය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 6 ක් වෙනුවෙන් ප්‍රාග්ධන දායකත්වය ලෙස එකතුව රු.මිලියන 218,245 ක් සපයා තිබුණි. එම ආයෝජනයේ වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 204,367 ක් වූ අතර, එක් එක් ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ මුළු ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය ඍන රු.මිලියන 412,450 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධන දායකත්වය	අලාභ ලබන ලද ව්‍යවසායන්හි අලාභය අඩු කර ගැනීම සඳහා සහ ලාභ ලැබීමේ තත්වයට ගෙන ඒම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම්හි අඩු වීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි හෙළිදරව් කළ යුතු වීම.

	වත්කමක් ලෙස දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් හානිකරණය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය.		
(අඕ)	සමාලෝචිත වර්ෂය ආරම්භක හා අවසාන දිනට එකතුව රු.මිලියන 1,935,429 ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් එකතුව රු.මිලියන 550,744 ක් පමණක් විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් වල කර ඇති ආයෝජනය හානිකරණයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	අලාභ ලබන ලද ව්‍යවසායන්හි අලාභය අඩු කර ගැනීම සඳහා සහ ලාභ ලැබීමේ තත්වයට ගෙන ඒම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.	-එම-
(අක)	රාජ්‍ය ව්‍යවසායන් 21 කට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව, ප්‍රාග්ධන දායකත්වය සහ 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රජයේ ප්‍රාග්ධන දායකත්වය අතර රු.මිලියන 25,898 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකඟ වෙමි.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියාමාර්ග ගැනීමට හා ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.
(අග)	Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව, 2024 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,574 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබූ අතර, 2024 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 525 ක් විය. කෙසේ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අගයට අමතරව රු.මිලියන 772 ක ප්‍රාග්ධන දායකත්ව ශේෂයක් පැවතුණි.	එකඟ වෙමි.	-එම-
(අච)	රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,150,312 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 1,167,570 ක් වීම හේතුවෙන් ඒ අතර රු.මිලියන 17,258 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකඟ වෙමි.	-එම-

(අජ)	රාජ්‍ය සමාගම් 06 කට අදාළ හිමිකාරිත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නිකුත් කළ අගය අනුව ගණනය කිරීමේදී 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 6,549 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 15,893 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වය හා සැසඳීමේදි රු.මිලියන 9,344 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම වෙනස්කම් වලට බලපාන්නාවූ හේතු වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	-එම-
(අට)	මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුල රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 87,285 ක් වූ අතර ඉන් රු.මිලියන 33,674 ක් එනම් සියයට 38 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළි ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල් වලින් සමන්විත වී තිබුණි.	රජයේ ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය ව්‍යවසායන්හි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා එනම් එදිනෙදා ව්‍යාපාර කටයුතු සිදු කර ගෙන යාමේදී දැරීමට සිදුවන පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීමට මහා භාණ්ඩාගාරය වෙතින් මුදල් ලබා දීම රජයේ ආයෝජනයක් ලෙස සලකා කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙමි.	පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීම තුළින් ආයතනවල ප්‍රාග්ධන දායකත්වයන් වැඩිවීමක් සිදු නොවන බැවින් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම.
(අඩ)	2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 12 ක් වෙනුවෙන් රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 11,601 ක් ලෙස දක්වා තිබුණද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මෙම ආයතන වලට අදාළව සිදු කරන ලද ආයෝජනයන්හි වටිනාකම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර, ඊට අනුරූපී කොටස් සහතිකපත්‍ර ලද වහාම කොටස් සංඛ්‍යාව ද රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.	මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන ප්‍රාග්ධන දායකත්වය සඳහා වූ කොටස් සහතික කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම හා කොටස් සංඛ්‍යාව හෙළිදරව් කළ යුතු වීම.
(අණ)	රාජ්‍ය ව්‍යවසායන් 09 කට අදාළව ඉදිරිපත් කළ ඍජු ශේෂ සනාථ කිරීම් අනුව හා රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම රාජ්‍ය ව්‍යවසායන්වලට අදාළව මහා භාණ්ඩාගාරයට අයත් කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයන් හි වෙනස්කම් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී ඒ පිළිබඳවද වැඩි අවධානයක් යොමු කර අදාල සමාගම්වල සහයෝගීතාවය ද ලබා ගනිමින් කොටස් සංඛ්‍යාවේ ප්‍රතිශතයේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	-එම-
(අත)	2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 17 අනුව, රජය සතු සමාගම් හා අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී ලබා දී තිබූ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 42,356 ක් වුවද, වර්ෂය තුළ	2024 වර්ෂය තුළ රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති රජයේ ප්‍රාග්ධන දායකත්වයන්ගේ වැඩිවීම් තුළ මුදලින් මෙම වර්ෂය තුළදී සිදු කරන ලද ආයෝජන වටිනාකම මෙන්ම	සම්පූර්ණ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සටහන්වල අන්තර්ගත කළ යුතු වීම.

	ප්‍රාග්ධන දායකත්වයේ රු.මිලියන 10,699 ක වැඩිවීමට අදාළ කොටස් හිමිකමේ වෙනස්වීම ඇතුළු අනෙකුත් තොරතුරු පිළිබඳ විධිමත් අනාවරණයක් සිදුකිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවසාන ප්‍රාග්ධන ආයෝජන වටිනාකම ලෙස පමණක් දක්වා තිබූ අතර, එම ආයෝජනවලට අදාල තොරතුරු විගණනයටද ඉදිරිපත් නොවුණි.	වැරදි නිවැරදි කිරීම සඳහා සිදු කරන ලද ගැලපීම් ද ඇතුළත් වන බව සඳහන් කරමි.	
(අන)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, තැන්පත් ගිණුමේ පැවති රු.මිලියන 14.6 ක් වූ විදේශ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය ආදායමට බැරකර තිබුණි.	තැන්පතු ගිණුමකට අදාළව 2021.10.22 දිනැතිව ලැබී තිබූ රු,1,860,000 ක මුදල එම ව්‍යාපෘතිය 2024 වර්ෂය වන විටත් ක්‍රියාත්මක නොවීම මත අදාළ අමාත්‍යාංශය වෙතින් අවස්ථා කිහිපයකදී විමසීමෙන් පසු හා මුදල් රෙගුලාසි ප්‍රකාරව එම මුදල රජයේ ආදායමට මාරු කර ඇත. ඉතිරි ව්‍යාපෘති 06 ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එක් එක් ව්‍යාපෘතියේ ඉතිරි මුදල් රු.12,752,424 ක් ගිවිසුම් ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.	ප්‍රදායකයන් ගේ විශ්වාසයද තහවුරු වන පරිදි ලැබුණු විදේශ ප්‍රදාන අදාළ අරමුණු වලට යෙදවීම පිළිබඳ සම්බන්ධීකරණය හා නියාමනය ශක්තිමත් කළ යුතු වීම.
(අප)	2024 ජනවාරි 01 දින වන විටත් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදාන ලෙස ලැබී තිබූ නමුත් 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාල අරමුණට නොයොදවා අක්‍රියව පැවති විදේශ ප්‍රදාන වටිනාකම රු.මිලියන 36.8 ක් විය.	එක් තැන්පතු ගිණුමකට අදාළව රු.15,013,178 ක මුදල සම්බන්ධව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අදාළ දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කල අතර ඒ සඳහා, 2025.04.10 දිනැති ලිපිය මඟින්, තවදුරටත් මුදල් රඳවා ගන්නා ලෙස එම දෙපාර්තමේන්තුව දැනුම් දී ඇත. තවත් තැන්පතු ගිණුමක පවතින රු.782,916 ක මුදල 2025 වර්ෂයේදී උපයෝජනය කිරීම සඳහා අදාල අමාත්‍යාංශය විසින් අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ඉල්ලා ඇත. එසේම, ඉතිරි තැන්පතු ගිණුම් 08ට අදාළව පවතින තැන්පතු මුදල් අදාල කාරණයට උපයෝජනය කරගන්නා ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව	අදාළ ප්‍රදාන ලැබී තිබූ අරමුණු ඉටුකර ගැනීමට අදාළ ආයතන මෙහෙයවීම සඳහා කටයුතු කළ යුතු වීම.

		විසින් අදාළ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	
(අබ)	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 08 ක එකතුව රු.මිලියන 1,047.6 ක විදේශ ප්‍රදාන ඍජුව ලැබී තිබුණි. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ දැනුවත්භාවයකින් තොරව විවිධ පාර්ශව වෙත විදේශ ප්‍රදාන ඍජුව ලබාගැනීමේ අවස්ථාව පවතින බවත් එම හේතුවෙන්, විදේශාධාර සම්බන්ධ ජාතික වශයෙන් පිළියල කරනු ලබන තොරතුරුවල නිවැරැදිතාවය හා සම්පූර්ණත්වය පිළිබඳ ගැටළු පැන නැගීම, නිසි නියාමනයකින් තොරව විදේශ ප්‍රදාන ලබා ගැනීමේ හා උපයෝජනය කිරීමේ අවධානමක් පැවතීම, රජයේ මූල්‍ය ප්‍රකාශවල නිවැරදි නොවන තොරතුරු අන්තර්ගතවීම, නිවැරදි නොවන තොරතුරු පදනම්ව රජයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ අවධානමක් ඇතිවීම වැනි අහිතකර තත්ත්වයන් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය.	1994.04.20 දිනැති අංක 30/94 දරණ චක්‍රලේඛය මෙන්ම විවිධ චක්‍රලේඛ හා උපදෙස් මඟින් ද පෙන්වා දී ඇති පරිදි නිසි ක්‍රමවේදය අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත්ව ලබාගන්නා ප්‍රදාන පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ පරිදි සටහන් කිරීම සිදුකරනු ලබයි. වෙනත් ආයතන වෙත පමණක් වාර්තා වූ ප්‍රදාන සම්බන්ධයෙන් එම චක්‍රලේඛ, උපදෙස් මාලාවන් හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානින්ගේ වගකීමක් වේ.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කරන ලෙස අදාළ ආයතන ප්‍රධානීන් නිරන්තරයෙන් දැනුවත් කිරීම.
(අම)	2019 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් විදේශ ප්‍රදානිත ව්‍යාපෘති 03 ක් සමඟ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 18 ක්, රු.මිලියන 290 ක් හා කොරියන් වොන් බිලියන 14.3 ක් වූ ගිවිසුම් වලට එළඹ තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඊට අදාළ විදේශ ප්‍රදාන ලද බවට විගණනයට තහවුරු නොවුණි.	මෙම ව්‍යාපෘති 03 සඳහා ප්‍රදානයන් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.	ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම් වලට එළඹෙන විදේශ ප්‍රදානයන් සම්පූර්ණ වශයෙන් ලබාගෙන, උපරිම වශයෙන් අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(අය)	වැය ශීර්ෂ 11 කට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම්වල රු.මිලියන 43 ක ශේෂයක් පැවතිය ද, එම එක් එක් ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශනවල (ACA-3) භාණ්ඩාගාරයේ පොත් අනුව එදිනට ශේෂයන් දක්නට නොතිබුණි. තවද, වැය ශීර්ෂයන්ට අදාළව රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබූ අග්‍රිම ගිණුම් අංකය අදාළ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව සඳහන් වූ අග්‍රිම ගිණුම් අංකය හා නොසැසඳුනු අවස්ථා නිරීක්ෂණය විය.	මෙම අග්‍රිම ශේෂයන් 2025 ජනවාරි 01 ත් 06 ත් අතර දිනයන්හිදී භාණ්ඩාගාරය වෙත පියවා ඇති බැවින් එක් එක් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන යටතේ ශේෂයක් නොමැති ලෙස දක්වා තිබුණද, සිගාස් පරිගණක මුද්‍රිත සටහන්වල දැක්වෙන ශේෂය එදිනට භාණ්ඩාගාර පොත් අනුව පියවා නොතිබුණි. තවද, සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය හරහා එක් එක් ආයතන වාර්තාකරනු ලබන තොරතුරු රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. එම තොරතුරු නිසි පරිදි දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම අදාළ දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි සතු වගකීමකි.	ගිණුම් වර්ෂය අවසානයේදී අග්‍රිම ශේෂයන් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කල යුතු අතර එක් එක් ආයතන සමඟ සැසඳීම් කාලීනව සිදු කළ යුතු වීම.
(අර)	රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තැන්පතු ශේෂයන් අදාළ ආයතනයන් හි මූල්‍ය ප්‍රකාශන වල තැන්පත් ශේෂයන් සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී එම ශේෂයන්හි පිළිවෙළින් රු.මිලියන 19 ක හා රු.මිලියන 16 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ආයතන 14 කට අදාළ අවුරුදු 2 ක ඉක්මවූ තැන්පතු ගිණුම් 40 කට අදාළ රු.මිලියන 2,284 ක් වූ ශේෂයන් පැවතුණි.	තැන්පත් ගිණුම් සම්බන්ධව මු.රෙ. 427 අනුව, සැසඳීම් සිදු කළ යුතු බැවින් පොදු තැන්පත් ගිණුම්වල ශේෂ නිරවුල්ව පවත්වාගෙන යාම හා ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කිරීම අදාළ ආයතනවල ප්‍රධාන ගණන්දීමේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි. තවද, සාධාරණ හේතු වලට අමතරව වෙනත් හේතු සහ එසේ හේතු ඉදිරිපත් කර නොමැති ආයතනවලින් විමසීම අප විසින් සිදුකරමින් පවතී.	ආයතන සමඟ ශේෂ සැසඳුම් කල යුතු අතර දීර්ඝකාලීනව පවතින තැන්පතු ශේෂ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වීම.
(අල)	2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම රජයේ, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ශේෂය රු.මිලියන 32,268 ක් වුව ද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම ශේෂය රු.මිලියන 31,370 ක් වී තිබුණි. ඒ අනුව, රු.මිලියන 898 ක වෙනසක් නිරීක්ෂණය විය.	අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එවන ලද අත්තිකාරම් බී ගිණුම්වල කේවල ශේෂය සහ භාණ්ඩාගාර ශේෂය අතර පවතින වෙනස නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කරන මෙන් අදාළ ආයතන වෙත උපදෙස් ලබා දීමට කටයුතු කරමින් පවතී.	අයවිය යුතු අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.

(අච)	උප ණය ලබා දුන් ආයතනවලින් ලද ණය ශේෂ සනාථ කිරීමේ ලිපි සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී රජයේ මූල්‍ය ප්‍රකාශනවල උපණය ශේෂය පිළිවෙලින් රු.මිලියන717.1 කින් හා රු.මිලියන 1,127.8 කින් වෙනස්කම් නිරීක්ෂණය විය.	ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ක්‍රියාත්මක වූ ඉතා පැරණි ණය ගිවිසුම් 03 ක් දීර්ඝ කාලයක සිට ක්‍රියාකාරී නොවන මට්ටමේ පවතින අතර නව ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මෙම ණය ක්‍රම මහ බැංකුව විසින් මෙහෙයවීමක් සිදු කළ නොහැකි බැවින් මෙම ශේෂ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාරය වෙත පැවරීම සඳහා වාර්තාවක් ලබා දෙන බව දන්වා ඇත. තවද, ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානයන් වශයෙන් රු.12,470,795 ක මුදලක් දරා ඇති අතර ඒ පිළිබඳව තොරතුරු කැඳවීමෙන් අනතුරුව ගිණුම්කරණමය නිවැරදි කිරීම් සිදු කිරීමට නියමිතය. ඊට අමතරව භාණ්ඩාගාරයේ පොත් වල හා අදාළ ආයතනයේ පොත්වල උපණය ලබා දීම් හා ආපසු අයකිරීම් ගිණුම්ගත කිරීමේදී සිදුව ඇති වෙනස්කම් මීට හේතු වී ඇත.	උපණය ශේෂයන් අදාළ ආයතනයන් සමඟ කාලීනව සසඳා නිසි පරිදි ගිණුම් තබා ගත යුතු වීම.
(අස)	විදේශ ව්‍යවහාර මුදල් මඟින් ලබා දී තිබූ භාණ්ඩාගාර ඇපකර දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති විදේශ විනිමය අනුපාතයන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද විදේශ විනිමය අනුපාතයන්ගෙන් වෙනස් වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල භාණ්ඩාගාර ඇපකර වටිනාකම රු.මිලියන 23,350 කින් වෙනස් බව නිරීක්ෂණය විය.	ඉදිරියේදී මෙවැනි වෙනසක් ඇතිවීම වැළැක්වීම සඳහා කටයුතු කරන බව දැනුම් දෙමි.	එක් ගනුදෙනුවකට අදාළව සෑම දෙපාර්තමේන්තුවක්ම යම් නිශ්චිත දිනකට එකම විනිමය අනුපාතයක් යටතේ සිදු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වීම.
(අහ)	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් මස 12 දින ගෙන තිබූ අන්තර්කාලීනව විදේශ ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව, 2022 අප්‍රේල් මස 13 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දින තෙක් ණය ගිවිසුම් 334	ඉදිරියේ දී අවශ්‍ය හෙළිදරව්කිරීම් ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට වැදගත්වන තොරතුරු හෙළිදරව් කළ යුතු වීම.

	කට අදාළව ණය වාරික තුළ ඇතුළත් රු.මිලියන 479,674 ක මූලික ණය මුදල ද රු.මිලියන 114,130 ක් වූ පොළිය ද ඇතුළුව රු.මිලියන 593,804 ක ණය ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවා තිබුණද, ඒ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබූ අතර ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2022 අප්‍රේල් 12 දින සිට ඉහත ණය ගිවිසුම්වල උපයෝජනය නොකළ ණය ශේෂ මත කැපකරු ගාස්තු (Commitment Fee) ගෙවීමේදී සාමාන්‍ය කැපකරු ගාස්තු වටිනාකම හෝ ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් එම වටිනාකමට වඩා ඉහළ වටිනාකමක් හෝ ගෙවීමට සිදුවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය.		
(අළ)	2024 වර්ෂය තුළ ණය ප්‍රදායක ආයතන 04 ක් සමඟ රු.මිලියන 128,663 ක ණය සඳහා ගිවිසුම්ගත වී තිබුණද, එම ණය ගිවිසුම්වලට අදාළ ප්‍රතිලාභී වීම් 2024 වර්ෂය තුළ ලැබී නොමැති බව නිරීක්ෂණය වූ අතර එලෙස ගිවිසුම්ගත වූ නමුත් ප්‍රතිලාභී නොවූ ණය ලබා ගැනීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේ දී හෙළිදරව්කිරීම් ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී.	-එම-
(ආඇ)	2024 දෙසැම්බර් 31 දිනට මූලික කටයුතු අවසන් වී ඇති නමුත් ගිවිසුම්ගත වී නොමැති රු.මිලියන 134 ක ණය ලබා ගැනීම් 03 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	ණය ප්‍රදායකයන් සමග ණය ලබා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇති අතර කිසිදු ණය ගිවිසුමක් අත්සන් කර නොමැති බැවින් රජයට කිසිදු බැරකමක් ඇති වී නොමැත.	-එම-
(ආආ)	රාජ්‍ය ව්‍යවසායන්වල මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් 05 ක් විසින් රු.මිලියන 3,690 ක මුදලක් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු බව දක්වා තිබුණද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂයන් අදාළ ආයතනවලින් ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන හෝ හෙළිදරව් කර නොතිබුණි.	රජයේ මූල්‍ය ප්‍රකාශනවල "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා වන වාර්තා කරනු ලබන කාලය හා මැනීමේ ක්‍රමය" යටතේ ප්‍රවර්තන වර්ෂය හා පෙර වර්ෂ සඳහා වන ආදායම් මුදල් පදනම යටතේ ගිණුම්ගත කරනු ලබයි.	-එම-

(ආඇ)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ආයතන 28 කට අදාළව ලබා දී තිබූ උපණය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු පොළී වටිනාකම රු.මිලියන 10,733 ක් වුවද එය රජයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	ලැබිය යුතු පොළී වටිනාකම හිඟ ආදායම් වාර්තාවේ සඳහන් කරන බව පමණක් දන්වා තිබුණි.	උපණය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට ලැබිය යුතු පොළී වටිනාකම රජයේ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වීම.
(ආඈ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රජයේ හිමිකම් දායකත්වය කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්හි කරන ලද ආයෝජනය සහ ලැයිස්තුගත නොවන සමාගම්හි කරන ලද ආයෝජනය ලෙස වර්ගීකරණය කර දක්වා නොතිබුණි. තවද කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්වල හිමිකාරීත්වයේ වටිනාකම එහි නාමික අගය පදනම් කරගෙන ගිණුම්ගත කර තිබුණද, ඒවායේ 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	රජයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, රජයේ හිමිකම් දායකත්වය කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම් හි කරන ලද ආයෝජන සහ ලැයිස්තුගත නොවන සමාගම් හි කරන ලද ආයෝජන ලෙස වර්ගීකරණයක් මේ දක්වා සිදු කර නොමැත. ඉදිරියේදී කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම්වල හිමිකාරීත්වයේ වටිනාකම කොටසක අදාළ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳපොල අගය මත පදනම්ව හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි.	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට වැදගත් තොරතුරු උචිත ලෙස හෙළිදරව් කළ යුතු වීම.
(ආඉ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව බැඳීම් හා බැරකම් රු.මිලියන 84,114 ක් ලෙස හෙළිදරව් කර තිබුණ ද, විගණන නියැදි පරීක්ෂාව අනුව ඊට ඇතුළත් නොවූ ආයතන 21 කට අදාළව එකතුව රු.මිලියන 58,367 ක් වූ බැඳීම් හා බැරකම් පැවැති බව අනාවරණය විය.	එක් එක් ආයතන විසින් වාර්තා කරන බැඳීම් හා බැරකම් සිගාස් වැඩසටහන වෙත උඩුගත කිරීම පිළිබඳ පැහැදිලි උපදෙස් 2024 වසර සඳහා භාණ්ඩාගාර පොත් පියවීමට අදාළ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ අංක 05/2024 හි ඡේද අංක 4.8 යටතේ සහ අදාළ බැඳීම් හා බැරකම් වාර්තා කිරීම සඳහා අවශ්‍ය ආකෘති 2024 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වන මාර්ගෝපදේශ අංක 06/2024 හි ඇතුළත් කර ඇත. රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත්තේ අදාළ වාර්තාකරණ ආයතන විසින් සිගාස් ගිණුම්කරණ පද්ධතිය හරහා භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති බැඳීම් හා බැරකම් වටිනාකම් වේ.	රජයේ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් සම්පූර්ණ හා නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම.

(ආර්)	විගණනයට ලද තොරතුරු අනුව, ආයතන 15 කට අදාළව අයවැය ප්‍රතිපාදන නොමැතිව එළඹ තිබූ දින 90 ඉක්ම වූ රු.මිලියන 85,722 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	නිසි පිළිතුරක් ලැබී නොතිබුණි.	-එම-
(ආඋ)	2023 අංක 34 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනය අනුව, 204 දරන ශීර්ෂයට අදාළව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා වූ ලැබීම්වල අවම සීමාව ලඟා කර ගෙන නොතිබුණි.	අවම ලැබීම් සීමාව රු.4,850,000 ක් ලෙස සංශෝධනය කර ඇත. කෙසේ වුවද, අවම ලැබීම් රු.4,846,846 ක් වී තිබුණි.	විසර්ජන පනතෙන් නියම කරන ලද සීමාවන් වලට අනුකූලව කටයුතු කළ යුතු වීම.

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත	(i) 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතු වුවත්, 2024 දෙසැම්බර් 31 දිනට එම සීමාව සියයට 94.39 ක් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.	පිළිතුරු ලැබී නොමැත.	පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.

බැරකම්	2024 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම* රු.බිලියන
බැංකු අයිරාව	105
රාජ්‍ය ණය	29,627
මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකළ	
විදේශ ණය	01
මුළු බැරකම්	**29,733**
ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය	31,500
මුළු බැරකම ඇස්තමේන්තුගත ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස	**94.39**

* රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබා දී තිබූ ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 1,454 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවල විගණනයට ඉදිරිපත් කළ බැරකම් හා බැඳීම් ප්‍රකාශය අනුව රු.බිලියන 84 ක් වටිනා බැරකම් ඉහත බැරකම්වලට ඇතුළත් කර නොමැත.

(ii) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (අ) වගන්තිය අනුව "2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම" ආණ්ඩුව විසින් අනුගමනය කළ යුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදක වූ පරමාර්ථයක් ලෙස දැක්වේ. එසේවුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි ඇස්තමේන්තු කිරීමටත්, සමාලෝචිත වර්ෂය අවසානයට වූ තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි පවත්වාගෙන යාමටත් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිශතයන් පිළිවෙලින් ඇස්තමේන්තුගත අයවැය පරතරයට අදාළව සියයට 9.93 ක් හා තත්‍ය අයවැය පරතරයට අදාළව සියයට 6.75 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

පිළිතුරු ලැබී නොමැත.

පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.

ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය	අයවැය පරතරය		ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස	තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ % ලෙස
	ඇස්තමේන්තුගත	තත්‍ය		
රු.බිලියන	රු.බිලියන	රු.බිලියන	සියයට	සියයට
31,500	3,128	2,126	9.93	6.75

සටහන :

	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 අගෝස්තු 08 දින සිට ක්‍රියාත්මක වන බැවින් එදින සිට 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත අවලංගු වේ.		
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් 141 ක රු.මිලියන 6,511 ක හර ශේෂ නොපියවී පැවතුණි. ඉන් රු.මිලියන 35 ක ශේෂයන් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, එම ශේෂයන් මු.රෙ. 373 ප්‍රකාරව, නිරවුල් කර ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	• **අවු.1ට අඩු** වහාම පියවීමට කටයුතු කරන ලෙස අදාළ ආයතනයන්ට ලිඛිතව දන්වා ඇත. • **අවු. 1-2 අතර** අයකර ගැනීම සඳහා අදාළ ආයතන විසින් නඩු පවරා ඇති අතර ඒ අනුව, නඩු තීන්දු ලැබෙන තුරු මෙම මුදල් අයකර ගැනීමට හැකියාවක් නොමැත. • **අවු.5 ට වැඩි** මෙම ශේෂය පියවීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ ආයතනය වෙත ලබා දී ඇති අතර ආයතනය සමඟ සාකච්ඡා වාර ගණනක්ද පවත්වා ඇත.	මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.

3. කළමනාකරණ ක්‍රියාකාරකම්

3.1 විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, චීනයේ අපනයන ආනයන බැංකුවෙන් ලබාගත් ණය වර්ග 52 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට යොමු කර තිබුණි. ඒ තුළ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (ii) දැක්වෙන ව්‍යාපෘති ණය 48 ක්ද, සටහන් අංක 26 (iii) න් දැක්වෙන විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 ක් ද අන්තර්ගත වී තිබුණි. විස්තර පහත පරිදි වේ.		

(i)	ව්‍යාපෘති 44 කට අදාළව විදේශ ව්‍යවහාර මුදලින් ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය, 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ශේෂය ගණනය කර පසුව ණය කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය ද අඩු කර තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති 33 කට අදාළව ණය ශේෂ ඇමරිකානු ඩොලර් මිලියන 236 කින් ද, ව්‍යාපෘති 11 කට අදාළව ණය ශේෂ රෙන්මින්බී (යුආන්) මිලියන 275 කින් ද වැඩි වී තිබුණි.	මෙම වෙනස්වීම්, අදාළ එක් එක් ණය ප්‍රතිව්‍යුහගතකරණයට පෙර හා ඉන්පසු ඇති වූ වෙනස්කම් වේ. ඒ අනුව, විගණන නිරීක්ෂණ සමඟ එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ii)	විදේශීය මුදල් කාලීන ණය පහසුකම් 04 කට අදාළව ගණනය කරන ලද නොගෙවූ ණය පොළිය සහ දඩ පොළිය 2024 ජනවාරි 01 දිනට පැවති ණය ශේෂයට එකතු කර ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය ශේෂය ගණනය කර, පසුව කල්පිරෙන කාලය දීර්ඝ කර ණය පොළී අනුපාතය අඩු කර තිබුණි. ඒ අනුව, ණය පහසුකම් 03 කට අදාළව ණය ශේෂ ඇමෙරිකානු ඩොලර් මිලියන 258 කින් ද, එක් ණය පහසුකමකට අදාළව ණය ශේෂය රෙන්මින්බී (යුආන්) මිලියන 180 කින් ද ඉහළ ගොස් තිබුණි.	-එම-	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(iii)	2024 ජනවාරි 01 දිනට පැවති යුරෝ මිලියන 4.5 ක ණය ශේෂයට හිඟ හිටි ණය පොළිය හා දඩ පොළිය ලෙස යුරෝ 573,924 ක් එකතු කර එයින් යුරෝ මිලියන 2.4 ක් හෙවත් සියයට 48 ක් ණය හිමියන් විසින් අත්හැරීමෙන් (Hair cut) අනතුරුව ඉතිරි යුරෝ මිලියන 2.6 ක ශේෂය, 2024 වර්ෂය තුළදී ගෙවා නිම කර තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(iv)	ව්‍යාපෘති 03 කට අදාළව රෙන්මින්බී (යුආන්) මිලියන 40 ක ණය ශේෂය කිසිදු ප්‍රතිව්‍යුහගතකරණය කිරීමකින් තොරව 2024 වර්ෂය තුළ ගෙවා නිම කර තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ආ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 26 (iv) හි දක්වා ඇති 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 12,550 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය 11 ක් 2024 වර්ෂය තුළ දී ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි. ඒ අනුව, එම බැඳුම්කර 11 හි කල් පිරෙන කාලය දීර්ඝ කර ණය හිමියා විසින් නාමිකව ණය අත් හැරීමක් (Nominal Hair cut) සිදු කර තිබූ අතර අවම සාමාන්‍ය පොළී අනුපාතයක් නියම කර නව ජාත්‍යන්තර ස්වෛරීත්ව	මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2024.12.18 දිනැති මාධ්‍ය නිවේදන මඟින් මෙම තොරතුරු ලබාගත හැකිය.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.

බැඳුම්කර 08 ක් බවට පරිවර්තනය කර ඇති බව දක්වා තිබුණි. තවද, මෙම බැඳුම්කරවලට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ණය පොළිය ඇමෙරිකානු ඩොලර් මිලියන 3,750 ක් වූ අතර ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 08 හි වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 10,647 ක් වී තිබුණි.

3.2 දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි 01 දිනට ඇමරිකානු ඩොලර් මිලියන 240 ක් හෙවත් රු.මිලියන 77,742 ක් වූ ලංකා බැංකුවෙන් ලබා ගෙන තිබූ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (ව්‍යාපෘති නොවන) ණය මුදල හා එහි හිඟ හිටි පොළිය රු.මිලියන 6,601 ක් ද සහිතව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කරවලට පරිවර්තනය කර තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට එම ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු ලංකා බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 82,551 ක් වී තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ආ)	ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් භාණ්ඩාගාර ඇපකර මත රාජ්‍ය වාණිජ බැංකු දෙකකින් ලබා ගෙන, පසුව 2022 වර්ෂයේ දී මහා භාණ්ඩාගාරයට පවරාගත් ණය මුදලට අදාළව, 2024 ජනවාරි 01 දිනට පැවති ඇමරිකානු ඩොලර් මිලියන 2,435 ක් හෙවත් රු.මිලියන 788,682 ක ශේෂය පහත පරිදි ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(i)	ලංකා බැංකුවට ගෙවිය යුතු ණය වටිනාකම වූ රු.මිලියන 410,430 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 73,603 ක් ද ඇතුළුව ඇමරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ii)	මහජන බැංකුවට ගෙවිය යුතු ණය මුදලෙන් රු.මිලියන 136,698 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය රු.මිලියන 30,464 ක් ද ඇතුළුව ඇමෙරිකානු ඩොලර් වලින් යුක්ත කාලීන ණය පහසුකමක් බවට පරිවර්තනය කර, ඉතිරිය රු.මිලියන 224,358 ක් සහ එයට අදාළ හිඟ හිටි පොළිය වන රු.මිලියන 38,225 ක් ද ඇතුළුව ශ්‍රී ලංකා රුපියල් වලින් යුක්ත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබුණි.	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.

(iii)	ඉහත ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් පසු 2024 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 1,582 ක් හෙවත් රු. මිලියන 462,783 ද මහජන බැංකුවට ගෙවිය යුතු කාලීන ණය වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 546 ක් හෙවත් රු. මිලියන 159,823 ක් ද මහජන බැංකුවට ගෙවිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම රු.මිලියන 262,583 ක් ද වී තිබුණි.	විගණන නිරීක්ෂණ එකඟ වේ.	හා තොරතුරු ඉදිරිපත් කිරීමකි.

3.3 රට තුළ පැවති අර්බුදකාරි වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දේපළ වලට සිදු වූ හානි පූරණය කිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික ඇස්තමේන්තු මගින් කිසිදු ප්‍රතිපාදනයක් සලසා ගැනීමකින් තොරව, 2022 මාර්තු 31 දින සිට 2022 ජූලි 22 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික නිශ්චල දේපළ වලට සිදු වූ හානි සම්බන්ධයෙන් පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘතිය මගින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලද පරිපූරක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝගිකරගනිමින් 2023 වර්ෂයේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 41 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 1,050 ක් හා සමාලෝචිත වර්ෂය තුළ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 32 දෙනෙකුගේ චංචල දේපළ වලට සිදු වූ හානි වෙනුවෙන් රු.මිලියන 178 ක් ලෙස එකතුව රු.මිලියන 1,228 ක් ගෙවා තිබුණි.	ඉදිරියේ දී යම් වසරක අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී මෙවැනි හානි සඳහා පූර්ව වන්දි තක්සේරුකරණය කිරීමේ හැකියාවක් පැවතේ නම් හා එම හානිපූර්ණය කිරීම ඉදිරි වර්ෂය දක්වා කල් තැබීමට හැකියාවක් පැවතේ නම් ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදනය ඉදිරි වර්ෂයේ අයවැය ඇස්තමේන්තු තුළ ඇතුලත් කිරීමට කටයුතු කල හැකි වේ.	පවතින තත්ත්වයන් පිළිබඳව විමසිලිමත්ව කටයුතු කර ඇතිවිය හැකි තත්ත්වයන් පිළිබඳ තාත්විකව තක්සේරු කර වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	එසේම අක් මුදල් ලැබී ගෙවීම් සූදානම් කර තිබුණද, 2024 දෙසැම්බර් 31 දිනවන විටත් මුදල් ලබා නොගත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 9 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 39 ක් පවතින බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	-එම-	-එම-

3.4 රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක් පිහිටුවා 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. 2023 මැයි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ලැයිස්තුගත කර තිබූ ආයතන 72 ක් අනුබද්ධිත සමාගම් ලෙස ප්‍රතිව්‍යුහගතකරණය සඳහා වූ පාලක සමාගමක් (HOCO) 2025 මැයි 30 දින වන විටත් ස්ථාපිත කර නොතිබුණි. එසේ වුවද, එම පාලක සමාගම වෙත පවරාගෙන ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ලැයිස්තුගත ආයතන 08 ක් පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ වුවද තෝරාගත් ආයතන 08න් ආයතන 04 ක් 2022 සහ 2023 වර්ෂයන්හිදී බදු පෙර ලාභයක් උපයා තිබූ ආයතන බව නිරීක්ෂණය විය.	පාලක සමාගම පිහිටුවීම සිදුකළ හැකිව තිබුණේ රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණ සම්බන්ධයෙන් වූ නව පනත හඳුන්වාදීමෙන් අනතුරුව එම පනතෙහි ඇතුළත් විය යුතුව තිබූ ප්‍රතිපාදන අනුව වේ. නමුත් මීට පෙර රජය පැවති කාලය තුළ එම පනත සම්මත කර ගැනීමට අවස්ථාවක් නොලැබූ බැවින් පාලක සමාගම පිහිටුවීම සිදුකළ නොහැකි වී ඇත.	රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ සඳහන් ආකාරයට කටයුතු කිරීමට හෝ ඊට උචිත සංශෝධන විධිමත්ව ගෙන ඒමට හා ඒ අනුව කටයුතු කළ යුතු වීම.
(ආ)	එසේම, තෝරාගත් ආයතන 08න් ආයතන 07ක් සඳහා ගණුදෙනු උපදේශකවරු පත්කිරීම සඳහා 2023 වර්ෂයේදී අමාත්‍යමණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර ගණුදෙනු උපදේශකවරුන් වශයෙන් ගිවිසුම්ගත වූ විදේශීය ආයතන දෙක සඳහා සමාලෝචිත වර්ෂයේදී මුදල් අමාත්‍යාංශයේ අංක 18/62P දරන පොදු තැන්පත් ගිණුම මගින් රු.මිලියන 193 ක් ගෙවා තිබුණි. තවද, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකය පවත්වාගෙන යාම වෙනුවෙන් 2023 සහ 2024 වර්ෂ දෙක සඳහා එකතුව රු. මිලියන 121 ක් වැයකර තිබූ අතර එයින් රු.මිලියන 58 ක් එම ඒකකයේ වැටුප් ගෙවීම	රජය සතු ව්‍යාපාර ප්‍රතිව්‍යුහගතකිරීමේ ඒකකය මූලික ලෙස හඳුනාගත් ආයතන 08 ක ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු කළ අතර ඉන් බොහෝමයක් 2024 අගෝස්තු මස වන විට අවසන් අදියරේ පැවතුණි. නමුත් නව රජය මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් යළි සලකා බලමින් සිටින අතර පෙර ව්‍යාපෘති අතරින් ග්‍රෑන්ඩ් හයට් හෝටලය ප්‍රතිව්‍යුහගත කිරීම ඉදිරියට කරගෙන යෑමට මේ වන විට අවසර ලැබී ඇත. පැවති රජයේ ආර්ථික ප්‍රතිපත්තීන්ට අනුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආයතන 08 ක් හඳුනාගෙන තිබූ අතර ලාභ ලැබීම	අමාත්‍ය මණ්ඩල සංදේශයන්හි විස්තර කර ඇති පරිදි අලාභ ලබන අකාර්යක්ෂම ආයතන කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ බව සඳහන් ව ඇති බැවින් ප්‍රතිව්‍යුහගතකරණයේදී එම සාධකය සලකා බැලිය යුතු බව සහ එසේ නොවන්නේ නම් ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු සඳහා බලපා ඇති අනෙකුත් සාධක

වෙනුවෙන් වැය කර තිබුණි. කෙසේ වුවද, 2025 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වා තිබූ අතර ගෙවූ මුදල නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.	හෝ නොලැබීම ප්‍රතිව්‍යුහගතකරණය කළ යුතුය යන තීරණය ගැනීම සඳහා බලපාන සාධකය නොවන බව පෙන්වා දෙමි.	පැහැදිලිව හෙළිදරව් කළ යුතු වීම.

3.5 විදේශීය ව්‍යාපෘති ණය ලබාගැනීමේදී ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතුව පැවති ව්‍යාපෘති ණය 755 න් ව්‍යාපෘති ණය 549 කට අදාළව විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව, විදේශීය ව්‍යාපෘති ණය 78 කට අදාළ ණය ගිවිසුම්වල ස්වාධිපත්‍යයේ මුක්තිය විවිධ අයුරින් අත්හැරීමේ (Waiver of Sovereign Immunity) ඡේදයන් අන්තර්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.	මෙම ණය ගිවිසුම්වලට එළඹීමට පෙර මහ බැංකු මුදල් මණ්ඩලයේ, අමාත්‍ය මණ්ඩලයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ඇත. තවද, චීන රජය සහ ණය ප්‍රදානිත චීන මූල්‍ය ආයතන සමග ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡා අවසන් වී නොමැති හෙයින්, ශ්‍රී ලංකා රජය මුහුණ පා ඇති අවදානම සම්බන්ධයෙන් මේ අවස්ථාවේදී තීරණය කළ නොහැක. ශ්‍රී ලංකා රජය විසින් ද්වි පාර්ශවීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේදී තම මූල්‍ය සහ නීති උපදේශකවරුන් ලෙස Clifford Chance LLP සහ Lazard Inc. යන ජාත්‍යන්තර උපදේශකවරුන් පත් කර ඇති අතර එම උපදේශකවරුන්ගේ නිසි උපදෙස් අනුව ශ්‍රී ලංකා රජය අදාළ ණය ගිවිසුම්වල සඳහන් ස්වාධිපත්‍යයේ මුක්තිය අත්හැරීමේ වගන්තිවලටද අනුකූලව චීන රජය සහ ණය ප්‍රදානිත චීන මූල්‍ය ආයතන සමඟ තවදුරටත් ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡා පවත්වා ගෙන යනු ලබයි.	ඉදිරියේ දී විදේශීය ණය ලබා ගැනීමේ දී අදාළ ණය ගිවිසුම් වල ඇතුලත් ස්වාධිපත්‍ය යේ මුක්තිය අත්හැරීම පිළිබඳ ඡේදයන් සම්බන්ධව විශේෂ අවධානය යොමු කළ යුතු වීම.

3.6 වෙනත් නිරීක්ෂණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශීර්ෂ 04 ක් යටතේ වු රජයේ අනුමත අත්තිකාරම් ගිණුම් 10 ක එකතුව රු.මිලියන 1,344 ක් වු ශේෂයන් නිසි පරිදි නිරවුල් කිරීමකින් හෝ මු.රෙ. 518 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.	රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙත රජය ලබාදෙන අත්තිකාරම් සම්බන්ධයෙන් වගකීම එම ගිණුම පවත්වාගෙන යන ආයතන සතු වේ. කෙසේ වෙතත් ඒ සම්බන්ධව පසුවිපරම් ක්‍රියාවන් සිදුකරන බව කාරුණිකව දන්වමි.	දිගුකාලීනව නිරවුල් නොවී පවතින අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.

(ආ)	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් යටතේ, පළාත් සභාවලට ස්ථාන මාරු වූ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ලෙස ලබා දුන් රු.මිලියන 191 ක් මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම පැවතුණ ද එම වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.	මෙම තොරතුරු පරීක්ෂා කර නිවැරදිව හඳුනාගත් පසු පළාත් සභා වෙත උපදෙස් ලබා දී ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ.	-එම-
(ඇ)	ශීර්ෂ 03 ක් යටතේ වූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 03 ක එකතුව රු.මිලියන 9 ක් වූ ශේෂයක් හා ශීර්ෂ 02 ක් යටතේ එකතුව රු.408,233 ක් වූ ඍණ ශේෂයක් නිරවුල් නොවී වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.	මෙම ණය ශේෂ විවිධ අවස්ථාවන් වලදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වසා දැමීම හා පැවරීම මත ජනිත වී ඇති අතර මෙම ශේෂයන් ඉතා පැරණි ශේෂ වන අතර දෙපාර්තමේන්තුව සතුව පවතින තොරතුරු විශ්ලේෂණය කර අක්‍රියව පැවතීමට හේතු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.	දිගුකාලීනව නිරවුල් නොවී පවතින අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.
(ඈ)	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති උපණය ශේෂය රු.මිලියන 195,004 ක් වී තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අදාළ ආයතන උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ඉක්ම වූ රු.මිලියන 1,304 ක හිඟ උපණය වාරික ශේෂයක් අයකර ගත යුතුව පැවතුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	උපණය ගිවිසුම් ප්‍රකාරව උපණය වාරික අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට උපණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකමේ එකතුව රු.මිලියන10,733 ක් වූ අතර, ගිවිසුම ප්‍රකාරව ආයතන 3 ක ට අදාළව වසර 5 ඉක්ම වූ නොගෙවූ පොළිය එකතුව රු.මිලියන 912 ක් වී තිබුණි.	විගණන නිරීක්ෂණය හා එකඟ වේ.	රජයේ උපණය ලබාදීම හා උපණය සේවාවලට අයවිය යුතු පොළිය ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ඊ)	භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ	පද්ධතියේ court case management ක්‍රියාවලිය අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුව සඳහා පමණක් සංවර්ධනය කරන ලද අතර පද්ධතියේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ප්‍රධාන ප්‍රවාහයට අදාළ නොවන සීමිත ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය ඉහත	දැනටමත් පසුගාමී වී ඇති බැවින්, පද්ධතිය කඩිනමින් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම.

	ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 7,920 කට සමාන ඇ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. මේ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 5,647 ක් දරා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ රු.මිලියන 957 ක වියදමක්ද දරා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 6,605 ක් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආසන්න වශයෙන් වසර 14 ක කාලයක් ගත වී තිබූ මෙම පද්ධතිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 ක් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වී නොතිබුණි.	දෙපාර්තමේන්තුව මගින් භාවිතය ඇරඹුවද එම ක්‍රියාවලියේ ඇති අඩු වැදගත්කම හේතුවෙන් මේ වනවිට නොකඩවා ක්‍රියාත්මක නොවේ. ITMIS වැනි විශාල වපරිසරයකින් යුතු ක්‍රියාවලියක් එකවර රාජ්‍ය ආයතන සියල්ල තුලම ස්ථාපනය කිරීම ප්‍රයෝගිකව සිදුකල නොහැක. ඒ අනුව පද්ධතියේ අයවැය ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාවලියන් මුලින්ම ව්‍යාප්ත කර 2020 වර්ෂය වනවිට අවසන් කල අතර පද්ධතියේ වියදම් කළමනාකරණයට අදාළ ක්‍රියාවලියන් ව්‍යාප්තිය දෙවනුව ආරම්භ කරන ලදී. නමුදු කොවිඩ් (Covid) වසංගත තත්වය, සමාජ සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් පැවති අස්ථාවරත්වය, විදුලි සහ ප්‍රවාහන සේවා අඩපණ වීම නිසා පද්ධතියේ ව්‍යාප්ති කටයුතු සඳහා විශාල ලෙස බාධා පැමිණීම, දිවයින වටා සිදුකල පරිශීලකයින් පුහුණු කිරීමේ වැඩසටහන් ඉහත කරුණු නිසා ක්‍රියාත්මක කල නොහැකි විය. තවද පද්ධතිය සම්බන්ධයෙන් අභ්‍යන්තරව සහ බාහිර විශේෂඥයන්/කමිටු විසින් සිදුකල අධ්‍යයනයන් හේතුවෙන් පද්ධතිය මෙහෙයුම් සහ නඩත්තු සේවා ගිවිසුම යාවත්කාලීන කිරීම ප්‍රමාද කිරීමට සිදුවූ නිසා පද්ධතියේ ව්‍යාප්තිය අවසන් කිරීමට අවශ්‍ය අතිරේක පරිශීලක බලපත්‍ර ලබා ගැනීම 2025 වසරේ පෙබරවාරි මස දක්වා ප්‍රමාද විය.	
(උ)	තවද, මෙම ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුණු, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 6.7 ක වියදමක්ද දරා තිබුණි.	2016 වර්ෂය වන විට දැනට ද වැටුප් කළමනාකරණය සඳහා රාජ්‍ය අංශය තුළ භාවිත වන යල්පැනගිය මෘදුකාංගය වෙනුවට නව මෘදුකාංගයක් මුළු රාජ්‍ය අංශය සඳහාම ක්‍රියාත්මක කිරීමට වන අවශ්‍යතාව මුදල් අමාත්‍යාංශය විසින් හඳුනාගැනිණ. ITMIS පද්ධතිය තුළ සංවර්ධනය කළ වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය මුළු රාජ්‍ය අංශය සඳහාම ව්‍යාප්ත කිරීමට තාක්ෂණිකව සුදුසු ක්‍රියාවලියක් නොවීය. තවද, අතිරේක පරිශීලක බලපත්‍ර වෙනුවෙන් විශාල මුදලක් වැය කිරීමට සිදුවන නිසා එසේ කිරීම ආර්ථිකමය වශයෙන්ද අවාසිදායක	ආර්ථිකභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර මුළු රාජ්‍ය අංශය සඳහා වැටුප් කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කර ගත යුතු වීම.

	විය. ඒ අනුව, 2016 අප්‍රේල් මස පැවති අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති රැස්වීමේදී මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණයට සුදුසු වෙනත් මෘදුකාංගයක් සංවර්ධනය කිරීමට තීරණය කර තිබූ අතර ඒ අනුව ITMIS පද්ධතියේ සීමිත වැටුප් කළමනාකරණ ක්‍රියාවලිය තවදුරටත් සංවර්ධනය සිදු නොකරන ලදී. ඉහත තීරණය අනුව සකස්කළ e-Payroll වැටුප් කළමණාකරණ පද්ධතිය මේ වන විට මුදල් අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු තුළ පරීක්ෂණ ධාවනයක් ලෙස ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. මෙහි සාර්ථකත්වය මත ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතයි.	
(එ) 2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, පළාත් සභාවල ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කල නිලධාරීන්, සේවය හැරගිය නිලධාරීන්, ද්විතික පදනම මත ස්ථානමාරු/ අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, විදේශගත/දේශීය නිවාඩු මත සිටින නිලධාරීන් හා වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අය විය යුතු වසර 05 ත් 10 ත් අතර ශේෂය රු.මිලියන 108 ක් වූ අතර වසර 10 කට ඉක්මවූ ශේෂය රු.මිලියන 232 ක් වී තිබුණි.	සෑම වර්ෂයකම අවසානයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ පසු අයවීමට ඇති සියළුම ශේෂයන් විශ්ලේෂණය කරන අතර ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා පවතින චක්‍ර ලේඛ විධිවිධාන අනුගමනය කර නිරවුල් කර ගැනීමට කටයුතු කරන මෙන් අදාළ ආයතන දැනුවත් කරනු ලබයි. තවද, එම ණය ශේෂ කඩිනමින් නිරවුල් කරගැනීමට කටයුතු කිරීම ඒ ඒ ආයතනවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි. කාර්තුමය වශයෙන් එම ආයතනවල ප්‍රගතිය අප විසින් ගෙන්වා ගනු ලබන අතර ණය ශේෂයන් අයවීම් ප්‍රගතිය පරීක්ෂා කරමින්, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙමින් නිරන්තරයෙන් පසු විපරම් කරනු ලබයි.	හිඟ ශේෂයන් නිරවුල් කිරීම සඳහා ගෙන ඇති පියවර පිළිබඳව නිරන්තර පසුවිපරම් කළ යුතු වීම.

4. කාර්යසාධනය

4.1 ආදායම් ඇස්තමේන්තු කිරිම

විගණන නිරීක්ෂණය		කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 29,898 ක් වී තිබුණු අතර, 2023 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 27,419 ක් වී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂය හා සැසඳීමේදී දළ දේශීය නිෂ්පාදිතය රු.බිලියන 2,479 කින් හෙවත් සියයට 9 කින් වැඩි වී තිබුණි.	එකඟ වේ.	තොරතුරු ඉදිරිපත් කිරීමකි.
(ආ)	2024 වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ වාර්ෂික අයවැය මුල් ඇස්තමේන්තුව අනුව, රජයේ ආදායම රු.බිලියන 4,144 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එය රු.බිලියන 3,408 ක් වී තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට වඩා රජයේ ආදායම රු.බිලියන 736 කින් හෙවත් ප්‍රතිශතයක් ලෙස සියයට 22 කින් වැඩි කර රජයේ ආදායම ඇස්තමේන්තු කර තිබුණි.	එකඟ වේ.	-එම-
(ඇ)	2024 වර්ෂයේ රැස්කළ රජයේ ආදායම රජයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රු.බිලියන 4,061 ක් වී තිබූ අතර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී රු.බිලියන 83 කින් අඩු වී තිබුණි. එය 2023 වර්ෂයේ තත්‍ය ආදායම සමඟ සැසඳීමේදී සියයට 32 ක වැඩිවීමක් වුවද සමාලෝචිත වර්ෂයේ අයවැය හිඟය අඩුවීම සියයට 17 ක් පමණක් විය.	රාජ්‍ය ආදායමේ විචලනය මෙන්ම රාජ්‍ය වියදමේ ඇතිවන විචලනයෙහි තීව්‍රතාවයද අයවැය හිඟය/අතිරික්තයෙහි අඩු/වැඩි වීම කෙරෙහි බලපෑම් ඇති කරනු ලබයි.	-එම-

4.2 ආදායම් ඌනතාවය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව, ආදායමේ ඌනතාවය රු.බිලියන 1,309 ක් වී තිබුණු අතර එය ඉකුත් වර්ෂයේදී පැවති රු.බිලියන 1,650ට සාපේක්ෂව අඩු වී තිබුණි. 2006 සිට 2023 වර්ෂය දක්වා කාල පරාසය තුළ ඉහළම ආදායමේ ඌනතාවය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. එම කාල පාරාසය තුළ සෑම වර්ෂයකම රැස්කළ ආදායම රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමට අපොහොසත් වී තිබුණි. ආදායමේ ඌනතාවයේ අවම අගය 2007 වර්ෂයේදී වාර්තා වී තිබුණු අතර එය රු.බිලියන 43 ක් වී තිබුණු අතර, රැස්කළ රජයේ ආදායමෙන් සියයට 7.52 ක් නියෝජනය වී තිබුණි. එම කාල පරාසය තුළ සමස්ථ ආදායමේ ඌනතාවය රු.බිලියන 9,278 ක් වී තිබූ අතර එම ඌනතාවය පියවා ගැනීමට දේශීය හා විදේශීය ණය සහ විදේශ ප්‍රදාන ලබා ගෙන තිබුණි. මේ අනුව, එම කාල පරාසය තුළ දේශීය ණය රු.බිලියන 30,878 ක්ද, විදේශීය ණය රු.බිලියන 12,285 ක් හා විදේශ ප්‍රදාන රු.බිලියන 331 ක් වශයෙන් එකතුව රු.බිලියන 43,494 ක් ලබා ගෙන තිබුණි. එක් එක් වර්ෂයේදී එසේ ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් සියයට 4.44 ක සිට සියයට 45.59 ක පරාසයක ප්‍රතිශතයන් මඟින් ආදායමේ ඌනතාවය මූල්‍යනය කර තිබුණි. ලබා ගෙන තිබුණු ණය හා ප්‍රදානවලින් ආයෝජනයන් සිදු නොකර පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සියයට 20.25 ක්ද, 2020 වර්ෂයේදී සියයට 45.59 ක්, 2021 වර්ෂයේදී සියයට 42.39 ක්, 2022 වර්ෂයේදී සියයට 30.59 ක්, 2023 වර්ෂයේ දී සියයට 19.65 ක් හා 2024 වර්ෂයේ දී සියයට 19.02 ක් වශයෙන් උපයෝජනය කර තිබුණි.	සටහන් කර ගතිමි.	ආදායම් ඌනතාවය අවම කර ගැනීම සඳහා ආදායම් රැස්කර ගැනීම තවදුරටත් කාර්යක්ෂම කිරීම හා වියදම් තවදුරටත් තාර්කිකරණයකළ හැකි අවස්ථා හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ආ)	සමාලෝචිත වර්ෂයේදී ණය පොළී වියදම ලෙස රු.බිලියන 2,689 ක් ගෙවා තිබුණු අතර, එය මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 50 ක් නියෝජනයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ ණය පොළී වියදම් ගෙවීම් රු.බිලියන 2,455 ක් හෙවත් මුළු පුනරාවර්තන වියදමෙන් සියයට 51.91 ක් වී තිබුණි. පොලී ගෙවීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.බිලියන 234 කින් වැඩි වී තිබුණි. තවද, එවකට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශීය ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව, 2022 අප්‍රේල් 13 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ඇතැම් ණය වාරික හා පොලී ගෙවීම් අත්හිටුවා තිබුණු නමුත්, ඊට අදාළව වූ ගෙවීම් සිදු කලේ නම් එම ඌනතාවය තවදුරටත් වර්ධනය වන බව නිරීක්ෂණය විය. එමෙන්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ලබා ගන්නා ලද දේශීය ණය ප්‍රමාණය සියයට 62 කින් අඩු වී තිබුණද ඒ සඳහා ගෙවූ පොළිය සියයට 49 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේදී රු.බිලියන 151 ක් වූ පොලී ගෙවීම් 2024 වර්ෂය වන විට රු.බිලියන 2,689 ක් දක්වා සියයට 1,681 කින් වැඩි වී තිබුණි. අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ණය ලබා ගැනීමට සිදුවී තිබූ අතර ඒ සඳහා වන පොලී ගෙවීම වාර්ෂිකව වැඩි වී තිබුණි. 2024 වර්ෂයේදී අයවැය කාර්යසාධනය හා හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය අනුව රැස්කරන ලද රු.බිලියන 4,061 ක රජයේ ආදායමෙන් පොලී ගෙවීමට රු.බිලියන 2,689 ක් හෙවත් සියයට 66.21 ක් වැයකර තිබුණි.	සටහන් කර ගතිමි.	-එම-
(ඇ)	ආදායම් රැස්කරන ප්‍රධාන ආයතනය වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අදාළව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ ආදායම් ශේෂයේ එකතුව රු.බිලියන 1,217 ක් වී තිබුණි.	මෙම ආයතනවල හිඟ ආදායම් එකතු කිරීම හා එහි ප්‍රගතිය සම්බන්ධව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් මාසිකව පවත්වනු ලබන ආදායම් කළමනාකරණය හා මුදල් ප්‍රවාහ සම්බන්ධයෙන් වන	-එම-

(ඇ)	බදු පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ පවතින අඩුපාඩු, හිඟ බදු අභියාචනා ක්‍රියාවලියේ දීර්ඝ කාලීන භාවය, හිඟ බදු අයකර ගැනීම සම්බන්ධයෙන් අධිකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට විශේෂිත වූ අධිකරණ පද්ධතියක් ස්ථාපිත වී නොතිබීම යන හේතු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු අයකිරීමේ ප්‍රමාදයට බලපා තිබුණි.	රැස්වීම් වලදී විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. කෙසේ වුවද, 2015.07.020 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍ර ලේඛ 01/2015 අනුව හිඟ ආදායම් රැස් කිරීමේ වගකීම පැවරී ඇත්තේ අදාළ ගණන් දීමේ නිලධාරී වෙතයි. රබැවින් එම ආයතන සම්බන්ධ හිඟ ආදායම් රැස්කිරීමේ වගකීම් ද එම ආයතනයන් හි ගණන් දීමේ නිලධාරීන් වෙත පැවරේ.	
(ඉ)	වඩාත් නිවැරදි ආකාරයට ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම හෝ පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තු අනුව ආදායම රැස් නොකිරිමත්, අරපිරිමැසුම්දායක ලෙස වියදම් කළමනාකරණය අපේක්ෂා කළ පරිදිම සිදු නොවීමත් නිසා රාජ්‍ය ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. එම ණය ලබා ගැනීම වාර්ෂිකව වැඩි වී තිබීම නිසා ණය පොලී පිරිවැය වාර්ෂිකව වැඩිවී තිබීම හේතුවෙන් පුනරාවර්තන වියදම වැඩි වී තිබුණි. ඇස්තමේන්තු කළ ආදායම අපේක්ෂිත පරිදි රැස් කර ගැනීමට නොහැකි වීමත්, පුනරාවර්තන වියදම වැඩිවීමත් නිසා වාර්ෂිකව වියදම පියවා ගැනීමට ආදායම ප්‍රමාණවත් නොවීම නිසා ආදායම් ඌනතාවය වාර්ෂිකව වැඩි වී තිබුණි.	ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ජනතාව මෙන්ම ආර්ථිකය නැවත යථාවත් කරමින් ඵලදායී නොවන රාජ්‍ය වියදම් අවම කරමින් දැඩි රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික වර්ගීකරණයට අනුව 2024 වර්ෂය සඳහා වූ රජයේ මුළු ආදායම් ඇස්තමේන්තුවෙන් (බදු ආදායම, බදු නොවන ආදායම හා විදේශ ප්‍රදානද සමඟ) සියයට 99.1 ක් ලෙස ඉතා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇති අතර, 2023 වර්ෂයට සාපේක්ෂව රාජ්‍ය ආදායම සියයට 33.1 කින් වර්ධනය වී ඇත. විශේෂයෙන්ම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැලකීමේ දී මෑත ඉතිහාසයේ වැඩිම අගය වූ සියයට 13.7 ක් ලබා ගැනීම රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ කැපීපෙනෙන සංධිස්ථානයකි. කෙසේ වුවද, රාජ්‍ය සේවක වැටුප් සංශෝධන, විශ්‍රාම වැටුප් ගෙවීම, අවධානමට ලක්විය හැකි කාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා සුබසාධක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, භාණ්ඩ හා සේවා මිල ඉහළ යාම, රජයේ පාලනයෙන් තොර රාජ්‍ය ණය පොළී ගෙවීම් ද හේතුවෙන්	-එම-

	පුනරාවර්තන වියදම් 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 13.6 කින් වැඩි වී ඇත. මෙම වියදම් රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගැනීම සඳහා මෙන්ම රටේ නිදහස් අධ්‍යාපනය සෞඛ්‍ය ආදී සුබසාධක වැඩසටහන් හා අවධානමට ලක්විය හැකි පිරිස් ආරක්ෂා කිරීමේ වැඩසටහන් නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීම මෙන්ම රටේ සංවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීම ආදිය හේතුවෙන් රාජ්‍ය වියදම සියයට 14.5 කින් වැඩි වී ඇත. එබැවින් රාජ්‍ය ආදායම තුලින් පමණක් ආදායම් ඌනතාවය වැඩිවීම වැලැක්වීම ප්‍රායෝගිකව අභියෝගාත්මකය.	

4.3 අයවැය හිගය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 වර්ෂයේ අයවැය හිගය රු.බිලියන 2,126 ක් වී තිබූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.11 ක් වී තිබුණි. 2023 වර්ෂයේ අයවැය හිගය රු.බිලියන 2,584 ක් වී තිබුණු අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.35 ක් වී තිබුණි. 2006 සිට 2024 වර්ෂය දක්වා සමස්ත කාල පරාසය පුරාවට අයවැය හිගයන් පැවැතුණු අතර, එය 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 300 ක අයවැය හිගය 2024 වර්ෂය වන විට රු.බිලියන 2,126 ක් දක්වා වර්ධනය වී තිබුණි. එම කාලපරාසය තුළ ඉහළම අයවැය හිගය 2023 වර්ෂයේදී වාර්තා වී තිබුණි. 2006 සිට 2024 වර්ෂය දක්වා අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට එය සියයට 5.55 ක සිට සියයට 14.08 ක් දක්වා පරාසයක පැවතුණි. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(අ) වගන්තිය ප්‍රකාරව, තත්‍ය අයවැය හිගය තත්‍ය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පැවැතිය යුතුව තිබුණු සියයට 5 ක සීමාව එම කාල පරිච්ඡේදය තුළ කිසිම වර්ෂයකදී පවත්වා ගෙන නොතිබුණි. කෙසේ වෙතත් 2016, 2017 හා 2018 වර්ෂවලදී පිළිවෙලින් සියයට 5.55 ක්,	පිළිතුරු ලැබී නොතිබුණි.	අදාළ නීතිමය විධිවිධාන වලට අනුකූල වෙමින් අයවැය හිගය අවම කරගත යුතු වීම.

සියයට 5.69 ක් හා 5.59 ක ප්‍රමාණයන්ගෙන් ඉහත සීමාවට ආසන්න වශයෙන් පවත්වා ගැනීමට හැකි වී තිබුණි.

4.4 **බදු අභියාචනා ක්‍රියාවලිය**

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2025 ජනවාරි 31 දින වනවිට බදු අභියාචනා කොමිෂන් සභාවේ ලියාපදිංචි කර ඇති එහෙත් විසඳා අවසන් නොවූ අභියාචනා 506ක් පැවති අතර ඊට අදාල බදු වටිනාකම රු. මිලියන 110,395 ක් වී තිබුණි. මේ තුළ රු. බිලියනය ඉක්මවූ එකතුව රු. මිලියන 70,494 ක් වූ අභියාචනා 29 ක් හා රු.මිලියන 100 ත් 1000 ත් අතර එකතුව රු. මිලියන 33,096 ක් වූ අභියාචනා 107 ඇතුළත්වී තිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ලියාපදිංචි වී තිබුණද කිසිදු විභාග කිරීමක් ආරම්භ කර නොතිබූ බදු වටිනාකම රු.මිලියන 3,408 ක්වූ අභියාචනා 27ක් හා විභාග කිරීම ආරම්භ කර ඇතත් නිශ්චයන් ලබා දී නොතිබු එකතුව රු. මිලියන 106,990 ක් වූ අභියාචනා 483 ඇතුළත්වී තිබුණි. තවද, 2022 සිට 2025 ජනවාරි 28 දින දක්වා කාලය තුළ අභියාචනා විභාග කිරීම අවසන් වුවත්, අවසන් නිශ්චය ලබා දී නොමැති වූ 'Reserved Cases' 233 ක් පැවැති අතර ඊට අදාළ බදු මුදලෙහි වටිනාකම රු. මිලියන 36,514 ක් වී තිබුණි. මෙසේ බදු අභියාචනා විසඳීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ කටයුතු දීර්ඝ කාලයක් නිම නොකර සිටීමෙන් රජයට අයකරගත හැකිව පවතින අදායම් එකතුකර ගැනීමේ සැළකියයුතු ප්‍රමාදයක් සිදුවන බවත් හා ඒ හේතුවෙන් රජයට අනවශ්‍ය ඍජු හා වක්‍ර පිරිවැයක් දැරීමට සිදුවිය හැකි බවත් නිරීක්ෂණය විය.	2011 මැයි මස බදු අභියාචනා කොමිෂන් සභාව ස්ථාපිත වු අතර අභියාචනා විමසීම් කටයුතු ආරම්භ වී ඇත්තේ 2012 මාර්තු මාසයේ සිටය. කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට පෙර පැවති අභියාචනා ක්‍රියාවලිය යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැවති සමාලෝචන මණ්ඩලයෙන් (Boar of Review) භාරගත් අභියාචනා 71 ක් විමසීම් කටයුතු සඳහා මෙම කොමිෂන් සභාවට පවරා තිබුණි. 2011 අංක 23 දරණ බදු අභියාචනා කොමිෂන් සභා පනත 2013 දී සිදු වූ සංශෝධනයට අනුව විනිශ්චය සභා මණ්ඩල තුනක් පවත්වාගෙන යාමට ප්‍රතිපාදන සලසා තිබුණද, 2019 වර්ෂය දක්වාම සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුත් එක් විනිශ්චය සභාවක් වශයෙන් කොමිෂන් සභාව ක්‍රියාත්මක වී ඇත. එකී කාලය තුලද, 2019 සිට 2022 දක්වා තුන් අවුරුදු කාල සීමාව අවසානයේදී නව සාමාජිකයින් පත් කිරීම නිසි පරිදි සිදුවී නොමැතිවීම හේතුවෙන් අභියාචනා විමසීම් කටයුතු ද අඛණ්ඩව සිදු වී නොමැත.	බදු අභියාචනා සම්බන්ධව කටයුතු කඩිනමින් අවසන් කිරීමට හැකි යාන්ත්‍රණයක් සැකසිය යුතු වීම.

4.5 ණය ශේෂය වර්ධනය වීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අයවැය හිඟය වාර්ෂිකව වැඩි අගයක පැවතීම හේතුවෙන් ණය ලබා ගැනීම් ප්‍රමාණය ද ඊට අනුරූපීව වැඩි වී තිබුණි. රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2024 වර්ෂය අවසාන වන විට රජය විසින් ගෙවිය යුතු මුළු ණය ශේෂය (දේශීය හා විදේශීය) රු.බිලියන 29,627 ක් වී තිබුණි. එම ශේෂය තුළ දේශීය ණය වශයෙන් රු.බිලියන 18,893ක් ද, විදේශ ණය වශයෙන් රු.බිලියන 10,734 ක් වශයෙන් ද පැවතුණි. 2023 වර්ෂයේදී රජයේ ණය ශේෂය රු.බිලියන 29,150 ක් වී තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී ණය ශේෂය රු.බිලියන 478 කින් හෙවත් සියයට 1.6 කින් වැඩි වී තිබුණි. 2006 වර්ෂයේ පැවැති රු.බිලියන 2,431 ක රජයේ ණය ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 82.72 ක් වී තිබූ අතර, 2024 වර්ෂය අවසාන වන විට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 94.39 ක් වී තිබුණි. තවද, 2013 අංක 15 දරන සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3(ඊ) වගන්තිය ප්‍රකාරව රජයේ බැරකම් දළ දේශිය නිෂ්පාදිතයෙන් සියයට 80 කට වඩා අඩු විය යුතුව තිබුණත්, අනෙකුත් බැරකම් හැර රජයේ ණය බැරකම පමණක් එම සීමාව ඉක්මවා සියයට 94.39 ක් වී තිබුණි. එම තත්ත්වය 2020, 2021,2022 හා 2023 වර්ෂ වලදී ද පැවතුණි.	නිසි පිළිතුරක් ලැබී නැත.	අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන වලට අනුකූලව බැරකම් පවත්වාගත යුතු වීම.

රාජ්‍ය ණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2024 වර්ෂයට අදාල ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සහ සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම පහත පරිදි වේ.		

සංවර්ධන පාර්ශවක රුවන්	ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු (ප්‍රදාන ඇතුලත්ව) 2024 (එ.ජ.ඩො මිලියන)	සත්‍ය ප්‍රතිලබ්ධි අගය (ප්‍රදාන ඇතුලත්ව) 2024 (එ.ජ.ඩො මිලියන)	විචලනය (එ.ජ.ඩො මිලියන)	විචලනය, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස (%)
ලෝක බැංකුව	397	564.9	167.9	42
ආසියානු	600	862.1	262.1	44

සංවර්ධන බැංකුව				
චීනය	281	51.9	(229.1)	(82)
ජපානය	59	37.3	(21.7)	(37)
කොරියාව	39	4.3	(34.7)	(89)
මැද පෙරදිග රටවල් සහ ඔපෙක් අරමුදල	83	39.3	(43.7)	(53)
දකුණු ආසියානු රටවල්	124	-	(124)	(100)
රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල්	122	7.94	(114.06)	(93)
IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන	48	16.4	(31.6)	(66)
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	0	334	334	100
	-------	--------	-------	
	1,753	**1,918**	**165.1**	
	===	====	===	

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2024 වර්ෂයේ ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවේ මුළු වටිනාකම එ.ජ.ඩො මිලියන 1,753 ක් වුවද, සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම එ.ජ.ඩො මිලියන 1,918 ක් වීම හේතුවෙන් සත්‍ය උපලබ්ධි වටිනාකම, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට වඩා එ.ජ.ඩො මිලියන 165.1 කින් එනම් සියයට 9 කින් පමණ වැඩි වී තිබුණි.

සෑම වසරකටම අදාලව ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සකස් කරනු ලබන්නේ පෙර වසරේ දෙවන කාර්තුවේදීය. එය ඇස්තමේන්තු කිරීමේ දී අදාල එක් එක් සංවර්ධන පාර්ශවකරුවන්ට අදාලව ව්‍යාපෘති සඳහා ඉදිරි වසරට අපේක්ෂිත ප්‍රතිලබ්ධින් පිළිබඳ සලකා බලනු ලැබේ. කෙසේ වෙතත්, වසරට අදාලව සත්‍ය ප්‍රතිලබ්ධීන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන මිල උච්චාවචන මත ව්‍යාපෘති පිරිවැය වෙනස් වීම් හා විනිමය අනුපාත වෙනස් වීම් වැනි හේතු නිසා වෙනස් වේ. එසේ ම විවිධ අවස්ථාවලදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම මත ද සත්‍ය ප්‍රතිලබ්ධි ඇස්තමේන්තු ගත ප්‍රතිලබ්ධි වලට වඩා වෙනස් වේ.

තොරතුරු ඉදිරිපත් කිරීමකි.

(ii)	ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව යන පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් ණයවල සත්‍ය ප්‍රතිලබ්ධි වටිනාකම ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුව සමඟ සසඳන විට, පිළිවෙලින් සියයට 42 හා 44 කින් වැඩි වී තිබුණි.	ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා 2024 වර්ෂයට අපේක්ෂිත ප්‍රතිලබ්ධීන්, 2024 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද අය වැය ඇස්තමේන්තු පාදක කරගෙන සකස් කරන ලදී. එය දළ වශයෙන් ඩොලර් මිලියන 397කි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විස්තීරණ පහසුකමට සමගාමීව ලෝක බැංකුව මගින් අය වැය හිඟය පියවීම සඳහා ආසන්න වශයෙන් ඩොලර් මිලියන 200ක මුදලක් 2024 වර්ෂයේ ලබා දෙන ලදී. එය පුරෝකථනය සඳහා ඇතුලත් කර නොමැත. එසේම, ආසියානු සංවර්ධන බැංකු සහනදායි මූල්‍ය සම්පත් පැකේජයේ තවදුරටත් ලබා දිය හැකි ප්‍රතිපාදන පැවතීම මත හා ශ්‍රී ලංකාව ද අයවැය සහායක ප්‍රතිපාදන අවශ්‍යතාවය පැවති නිසා අයවැය සහායක ප්‍රතිපාදන ලබා ගෙන ඇත.	-එම-
(iii)	චීනය, ජපානය, කොරියාව, මැද පෙරදිග රටවල්, IFAD ඇතුළු එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන හා රුසියාව, ඕස්ට්‍රේලියාව සහ බටහිර රටවල් වලින් ලබා ගැනීමට අපේක්ෂා කල ණය පිළිවෙලින් සියයට 82, 37, 89, 53, 66 සහ 93 කින් අඩු වී තිබුණි.	ශ්‍රී ලංකා රජය විසින් ණය වාරික ගෙවීම තාවකාලිකව අත්හිටුවීම වීම නිසා චීනය, ජපානය, කොරියාව, රුසියාව හා ඕස්ට්‍රේලියාව යන රටවල් ණය ප්‍රතිලබ්ධීන් නවතනු ලැබූ අතර, ඇස්තමේන්තු සැකසීමේ දී, 2024 වසර තුල නැවත ප්‍රතිලබ්ධීන් ආරම්භ කරනු ඇතැයි වන උපකල්පනය මත පිහිටා ඇස්තමේන්තු කර ඇත.	විධිමත් පරිදි සැලසුම් සහගතව විදේශ ණය මූල්‍යානයක් සිදු කළ යුතු වීම.
(iv)	සමාලෝචිත වර්ෂයේ දී දකුණු ආසියානු රටවල්වලින් ණය ලබා ගැනීමට ඇස්තමේන්තු කලද, වර්ෂය අවසාන වන විටත් ණය ලබා ගෙන නොතිබුණි.	2024 වසරේ පැවති ආර්ථික පසුබිම හා රජයේ මූල්‍ය ප්‍රතිපත්ති මත හා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන්ව නොමැති නිසා ණය ලබා ගැනීමක් සිදුවී නොමැත.	-එම-

(v)	සමාලෝචිත වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 334 ක් ප්‍රතිලබ්ධිවී තිබුණද, ප්‍රතිලබ්ධි ඇස්තමේන්තුවට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් (IMF) කිසිදු ප්‍රතිලබ්ධිවීමක් ලැබෙන බවට ඇස්තමේන්තු කර නොතිබුණි.	ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලබා ගැනීම්, මුදල් අමාත්‍යාංශය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති එකඟතාව මත තීරණය වනු ඇත. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන සංවර්ධන ව්‍යාපෘති සඳහා වන ප්‍රතිලබ්ධීන් ඇස්තමේන්තු කිරීමේ දී එම අගයන් ඇතුලත් කර නැත.	-එම-

4.6 ලාභ හා ලාභාංශ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල රජය සතු ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 2,493,232 ක් වුවද, එම ආයෝජන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 41,080 ක ලාභ හා ලභාංශ ලැබී තිබුණි. එය සිදු කර තිබුණු ආයෝජන වටිනාකමෙන් සියයට 1.6 ක් විය.	එකඟ වෙමි.	රාජ්‍ය ව්‍යවසායන් සුපරීක්ෂණය හා නියාමනය විධිමත් කළ යුතු වීම.
(ආ)	2024 වර්ෂය සඳහා ලාභ ආදායම් වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 64,192 ක් වූ අතර තත්‍ය ආදායම රු.මිලියන 33,191 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 51 ක් පමණක් වී තිබුණි.	එකඟ වෙමි.	-එම-
(ඇ)	2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන රජය සතු ව්‍යාපාර සහ අනෙකුත් ආයතන සංඛ්‍යාව 305 ක් වුවද, ඉන් ආයතන 73 ක් සඳහා පමණක් ආදායම් ඇස්තමේන්තු සකස් කර තිබුණි ඉන් ආයතන 43 කින් පමණක් ලාභ හා ලාභාංශ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.	ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේදී ලාභ ලැබෙන ආයතන සැලකිල්ලට ගැනීම සිදු කළ බව දන්වා සිටින අතර, එසේ ඇස්තමේන්තුව තුළ ඇති ආයතන වලද වර්ෂය තුළ සත්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වය පදනම් කර ගෙන විචලතාවයන් සිදුවීමේ සම්භාවිතාවයක් පවතින බැවින්, ඇස්තමේන්තුගත කළ පරිදිම ලාභාංශ ආදායම් ලබා ගත නොහැකි වී ඇත.	රාජ්‍ය ව්‍යවසායන් සුපරීක්ෂණය හා නියාමනය විධිමත් කළ යුතු වීම හා රාජ්‍ය ව්‍යවසායන්හි භාණ්ඩාගාර නියෝජිතයන්ගේ කාර්යභාරය තවදුරටත් විධිමත් කිරීමට කටයුතු කළ යුතු වීම.

(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද නුබුන්වත් බව සහතික කරන රාජ්‍ය සමාගම්වල බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙන්වා ගත යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදි රාජ්‍ය සමාගම් 11 කට අදාළව 2023 වර්ෂයේ ලාභාංශ වලින් එකතුව රු.මිලියන 13,010 ක් වූ ලාභාංශ ආදායමක් එකතුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	එකඟ වේ. මෙම ආයතන වල මූල්‍ය තත්ත්වය සහ ඉදිරි ව්‍යාපාරික සැලසුම් සැලකිල්ලට ගෙන ඉදිරියේදී ලාභාංශ එකතු කර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි.	අදාළ ලාභ කොටස නිවැරදිව භාණ්ඩාගාරයට ප්‍රේශණය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම හා වඩා නිවැරදි ලෙස නියාමනය කළ යුතු වීම.

4.8 භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය තුළ හා ඊට පෙර කල් ඉකුත් වීම මත රු.මිලියන 143,094 ක සහ එකතුව ඇ.ඩො. 2,678.29 ක වටිනාකමින් යුතු භාණ්ඩාගාර ඇපකර 25 කට හා රු. මිලියන 32,550 ක හා ඇ.ඩො. 210 ක වටිනාකමින් යුතු සහන ලිපි 15 කට අදාළ වලංගු කාලය 2024 දෙසැම්බර් 31 දින වන විට නැවත දීර්ඝ කර තිබුණි.	2024 දෙසැම්බර් 31 වන විට නැවත දීර්ඝ කරන ලද සහන ලිපි ප්‍රමාණය 15 කි.	ඉදිරියේදී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ දී නිසි අධීක්ෂණයක් යටතේ ලබාදීමට කටයුතු කළ යුතු වීම.
(ආ)	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 11 ක දී නිකුත් කළ රු.මිලියන 102,474.21 ක්, ඇ.ඩො. මිලියන 2,824.31 ක් සහ යුරෝ මිලියන 12.29 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 17 ක දී නිකුත් කළ එකතුව රු.මිලියන 33,430 ක් සහ ඇ.ඩො. 210 ක් වටිනා සහන ලිපි 2024 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, අදාළ වලංගු කාල ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	අදාළ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි වලට අදාළ වලංගු කාලය 2025 මැයි 20 දින වන විටත් දීර්ඝ කිරීමට කටයුතු නොකිරීම පිළිබඳ වර්තමාන තත්ත්වය පැහැදිලි කර නිරීක්ෂණය පිළිගෙන තිබුණි.	-එම-
(ඇ)	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලීය රෝහල ඉදිකිරීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා එම විශ්ව විද්‍යාලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලබාගත් ණය මුදලින් 2024	අමාත්‍ය මණ්ඩල සංදේශය මත පදනම්ව අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත	-එම-

	මාර්තු මාසයට අදාළව හිඟව පැවති ණය වාරිකය හා පොළිය පියවීම සඳහා රු.මිලියන 2,200 ක්ද, සීමාසහිත ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත ගෙවිය යුතුව පැවති හිඟ ණය සහ පොළිය ගෙවීම සඳහා ඇ.ඩො. මිලියන 8 කට සමාන රු. මිලියන 2,400 ක් ද ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීම හේතුවෙන් එකතුව රු.මිලියන 4,600 ක මුදලක් හිඟ ණය හා පොළී ශේෂයන් පියවීම සඳහා මහා භාණ්ඩාගාරයට දැරීමට සිදුව තිබුණි.	ගෙවිය යුතු ණය සහ ණය පොළිය සඳහා රු.මිලියන 2,400 ක් ගෙවීම් සිදු කර ඇති අතර ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත ගෙවිය යුතු ණය සහ ණය පොළිය සඳහා රු. මිලියන 2,200 ක් ගෙවීම් සිදු කර ඇත.	

4.9 දේශීය හා විදේශීය ප්‍රදාන

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට පෙර ප්‍රදායකයන් 07 දෙනෙකුගෙන් ව්‍යාපෘති 13 කට අදාළව ලැබී තිබූ නමුත් අදාළ අරමුණට නොයොදවා සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.මිලියන 326.6 ක් අදාල ප්‍රදායකයින් වෙත ආපසු යවා තිබුණි.	ලෝක ආහාර වැඩසටහන යටතේ ක්‍රියාත්මක ඇතැම් වැඩසටහන් වෙත ලැබී තිබූ සම්පූර්ණ මුදලම අදාළ වැඩ සටහන ක්‍රියාත්මක නොවීම හා අනෙකුත් ව්‍යාපෘති /වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එම එක් එක් ව්‍යාපෘතියේ ඉතිරි වූ මුදල් ප්‍රදානකරුගේ ඉල්ලීම, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ එකඟතාවය හා අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලබන ආයතනයේ ඉල්ලීම මත ගිවිසුම් ප්‍රකාරව ප්‍රදායක ආයතනය වෙත ආපසු යැවීමට කටයුතු කර ඇත.	ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම.
(ආ)	2024 ජනවාරි 01 දින වන විටත් දේශීය ප්‍රදාන ලෙස ලැබී තිබූ රු.මිලියන 146.5 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ අරමුණට නොයොදවා ඇති බව නිරීක්ෂණය විය.	මෙම දේශීය ප්‍රදාන තැන්පතු මුදල් අදාල කාරණයට උපයෝජනය කරගන්නා ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම.

(ඇ)	පළාත් සභාවලට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා 09 වෙත රජයේ ප්‍රදාන ලෙස රු.මිලියන 428,331 ක් ලබා දී තිබුණි. රජයේ ප්‍රදාන හැර එම පළාත් සභා විසින් රැස්කරන ලද ආදායම රු.මිලියන 93,077 ක් වී තිබු අතර, ඒ තුළ රු.මිලියන 8,355 ක ආයෝජන ආදායම් ද අන්තර්ගත වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට සියළු පළාත් සභා සතු මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව රු.මිලියන 41,782 ක් වී තිබු අතර සභා 05 ක් සතුව එකතුව රු.මිලියන 67,511 ක අයෝජන පැවතුණි. ඒ අනුව පළාත් සභා 09 සතුව රු.මිලියන 109,292 ක ඉහළ ද්‍රවශීල වත්කම් පවතින බවත්, එමගින් ඉහළ ආයෝජන ආදායමක් උපයන බවත් නිරීක්ෂණය වන අතර රජය විසින් විවිධ මූල්‍යන මාර්ග මගින් ලබාගනු ලබන අරමුදල්, පළාත් සභාවලට රජයේ ප්‍රදාන ලෙස ලබා දීමේදී මෙම තත්ත්වය හා සමස්ථයක් ලෙස රජයට වන පිරිවැය පිළිබඳව විධිමත් සලකා බැලීමක් සිදු කර ඇතිද යන්න විගණනයේදී අනාවරණය නොවුණි. තවද, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභා 09 වෙත ලබා දී තිබු ප්‍රදාන වටිනාකම රු.මිලියන 439,383 ක් වීම හේතුවෙන් පළාත් සභාවල මූල්‍ය ප්‍රකාශන අනුව තිබු එකතු ප්‍රදාන වටිනාකම අතර රු. මිලියන 11,052 ක වෙනසක් නිරීක්ෂණය විය.	පළාත් සභා සඳහා ප්‍රදාන ලබා දීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ජ' විධිවිධානවලට අනුව මුදල් කොමිෂන් සභාව විසින් යොමු කරන නිර්දේශ ද, පවතින මූල්‍ය අවකාශය සීමාවන් ද සැලකිල්ලට ගනිමින් 2024 සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.	පළාත් සභා වලට රජයේ ප්‍රදාන ලෙස අරමුදල් ලබා දීමේදී රජයට වන සමස්ත පිරිවැය පිළිබඳව විධිමත් සලකා බැලීමක් කළ යුතු වීම.